**2025-08-07 බළන්ගොඩ ප්‍රාදේශීය සභා**
**මාසික මහා සභා රැස්වීමේ**
**සංක්ෂිප්ත වාර්තාව**

2025 අගෝස්තු මස 07 වන දින බළන්ගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.

**සහභාගිත්වය :**

1. ගරු සභාපති - ගමඇතිගේ ආරියදාස මැතිතුමා
2. ගරු උපසභාපති - බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.බී.ගුණරත්න මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.ඩබ්.තුෂාර කුමාර මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - යූ.ඉන්දික කරුණාරත්න මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.යූ.සී.තිලක් වික්‍රමසිංහ මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.නන්දසිරි මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි.සමන් කුමාර මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.නිශාන්ත කිත්සිරි මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - මුදිත ප්‍රසාද් මල්ලිකාරත්න මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.පී.එම්.සනත් ධර්මරාජ මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.එම්.ඩබ්.ලක්රුවනි සමරනායක මැතිනිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඩී.ඩී.ජයශීලි ලියනගේ මැතිනිය
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.කේ.අජිත් ප්‍රියන්ත මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බී.එන්.දීපශිකා පෙරේරා මැතිනිය
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එම්.ආර්.නයනජිත් හේමාල් මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි.එල්.පී.කුමාර ගුණසිරි මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ඩබ්.දර්මදාස මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.කේ.ඩබ්.ජගත් නිලන්ත කුමාර මැතිතුමා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමි
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.එම්.වජිරා ගීතානි වීරසේන මැතිනිය
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එම්.ශ්‍රියානි මැතිනිය
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.කේ.ඩී.රෝෂන් ක්‍රිස්ටි මැතිතුමා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.අසෝක්කුමාර් මැතිතුමා
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.එන්.විමලසේන දිසානායක මැතිතුමා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඩී.ඉඳුනිල් ප්‍රියන්ත මැතිතුමා
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඩබ්.අනුර ක්‍රිෂාන්ත් බස්නායක මැතිතුමා
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - යූ.රෝහණ පුෂ්පකුමාර මැතිතුමා
31. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ටී.කුසුම්සිරි අලංකාර මැතිතුමා
32. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.කේ.දහම් ගුණසේකර මැතිතුමා
33. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ජී.දනුෂ්ක සමන්ත කුමාර මැතිතුමා
34. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.සී.ඉන්ද්‍රානි ගුණසිංහ මැතිනිය
35. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.පී.නිලන්ති වීරවංශ මැතිනිය

**සහභාගි නොවූ :**

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.ඩබ්.පී.චන්ද්‍රාණි නන්දරත්න මැතිනිය
02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.රෝහණ ජගත් වීරසේකර මැතිතුමා

**<u>01.පසුගිය සභා වාර්තාව සම්මත කිරීම</u>**

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**
අපිට න්‍යාය පත්‍රයේ මුලින්ම තියෙන්නේ පසුගිය සභා වාර්තාව සම්මත කිරීම. ගරු මන්ත්‍රීතුමෙක් හෝ තුමියෙක් ඉදිරිපත් වෙලා ඒක සභා සම්මත කරන්න.

**ගරු උපසභාපති බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා**
පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බව මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඩී.ඩී.ජයශීලි ලියනගේ මැතිනිය**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බව මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**02.සභාපතිවරයා විසින් සභාවට ඉදිරිපත් කළ යුතු නිවේදන**
ගරු මන්ත්‍රීතුමනි, තුමියනි, අපි ලබන වසරේ අයවැය සකස් කරන් ඕනි. ඒ සඳහා ඔබතුමන්ලාගෙනුත් අපට අදහස් ලබා ගන්න තියෙනවා .ඒ නිසා ඔබතුමන්ලා නියෝජනය කරන කොට්ඨාශවලට අදාළව අපේ තියෙන ආදායම සහ වියදමත් සැලකිල්ලට අරගෙන යෝජනා ලබා දෙන්න කියලා මම මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා. එම තොරතුරු ලබා ගැනීමට අදාළ ආකෘතියක් අපි ඔබතුමන්ලාට ලබා දෙනවා. ඒ අනුව ඔබතුමන්ලාට ඉදිරිපත් කිරීමට පවතින යෝජනා අගෝස්තු 20 වන දිනට පෙර අපි ලබා දෙන ආකෘතිය අනුව පුරවලා කඩිනමින් ලබා දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.

**03.සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා**

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**
අද මාසික සභා රැස්වීමට නොපැමිණ සිටින ගරු මන්ත්‍රීතුමන්ලා සහ තුමියන්ලා ගේ නිවාඩු අනුමත කරන්න තමයි දැන් තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා**
අද දින බී.ඩබ්.පී.චන්ද්‍රාණි නන්දරත්න මැතිනියට සභා රැස්වීමට පැමිණීමට නොහැකි බැවින් ඇයගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බව මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.පී.නිලන්ති වීරවංශ මැතිනිය**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ආර්.නයනජිත් හේමාල් මැතිතුමා**
අද දින ඒ.කේ.රෝහණ ජගත් වීරසේකර මැතිතුමාට සභා රැස්වීමට පැමිණීමට නොහැකි බැවින් ඔහුගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බව මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.එම්.සනත් ධර්මරාජ මැතිතුමා**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව බී.ඩබ්.පී.චන්ද්‍රාණි නන්දරත්න මැතිනියගේ සහ ඒ.කේ.රෝහණ ජගත් වීරසේකර මැතිතුමාගේ නිවාඩු අනුමත කිරීමට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**04.මාසිකව සභාවට ලැබී ඇති ලියුම් ,පෙත්සම්,පැමිණිලි,සංදේශ හා නිවේදන ඉදිරිපත් කිරීම**
ඉදිරිපත් වී නැත
**05. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න** - ඉදිරිපත් වි නැත.

**06. යථා පරිදි කල් දී ඇති යෝජනා**

**06-01 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන ආපදා ණය මුදල ලබා දීම සම්බන්ධ යෝජනාව**

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

2025 අයවැය යෝජනා මඟින් රාජ්‍ය සේවකයන්ගේ අවම මූලික වැටුප වැඩිකිරීම සැලකිල්ලට ගෙන රාජ්‍ය සේවකයින් සඳහා ආපදා ණය ලබාදීමේ උපරිම සීමාව රු.250,000.00 සිට රු. 400,000.00 දක්වා ඉහළ නැංවීමට රජය තීරණය කරලා තියෙනවා. ඒ අනුව 2025/05/16 දින තීරණ අංක 27 අනුව මාසිකව නිලධාරීන් දෙදෙනෙකුට ලබා දෙන ලද ආපදා ණය මුදල මාසිකව එක් අයෙකුට (පොරොත්තු ලේඛනය අනුව) පමණක් ලබා දීමට තීරණය කරලා තියෙනවා. නමුත්,නැවතත් මසකට දෙදෙනෙකුට බැගින් ආපදා ණය මුදල ලබා දීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස කාර්ය මණ්ඩලයේ සියළු දෙනා විසින්ම ඉල්ලීමක් කරලා තියෙනවා. කාර්ය මණ්ඩලයේ සියළු දෙනාගේම අත්සන් ලේඛනයත් මේ සමග තිබෙනවා. ඒ අනුව මෙම ඉල්ලීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.එම්.සනත් ධර්මරාජ මැතිතුමා</u>**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව මාසිකව නිළධාරීන් දෙදෙනෙකුට පමණක් ආපදා ණය මුදල ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-02 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන සේවා ගිවිසුම සම්බන්ධ යෝජනාව**

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

මෙම සභාවේ රියදුරෙකු ලෙස සේවය කරන ඩබ්.කේ.ජේ.ඩබ්.වැලිගලගේ මහතා වසරක කාලයක් සඳහා වන සේවක ගිවිසුමක් මත තමයි සේවය කරන්නේ. ඒ අනුව එතුමාගේ සේවා ගිවිසුමේ කාලය 2025-08-23 දිනෙන් අවසන් වෙනවා. නැවතත් එදින සිට වසරක කාලයක් දක්වා මෙම ගිවිසුම් ගත කාලය දීර්ඝ කරන්න ඕනි. ඒ සඳහා මේ සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.සමන් කුමාර මැතිතුමා</u>**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව ඩබ්.කේ.ජේ.ඩබ්.වැලිගලගේ මහතාගේ සේවා ගිවිසුම් කාලය වසරකින් දීර්ඝ කිරීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-03 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන ගර්භනී මවුවරුන් සඳහා පෝෂණ මලු බෙදා දීම හා දැනුවත් කිරීම සම්බන්ධ යෝජනාව**

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

තිරසර සංවර්ධන ඉලක්ක කරා යන ගමනේදි " සෑම දෙසකම සෑම ආකාරයකින්ම පවතින දිළිඳු බව නිමා කිරීම" අරමුණු කර ගනිමින් ගැබිනි මව්වරුන්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීමට හා දිළිඳුකම තුරන් කිරීමට කටයුතු කිරීම සඳහා වැඩසටහන් වසරක් පාසා පවත්වනු ලබනවා.

ඒ අනුව මෙවරත් ගැබිනි මව්වරු වෙනුවෙන් වැඩසටහනක් 2025-09-15 වන දින පැවැත්වීමට තමයි සැලසුම් කරලා තියෙන්නේ. ඒ සඳහා අප බල ප්‍රදේශයේ වසම් මට්ටමින් තෝරා ගත් අඩු ආදායම්ලාභී මව්වරු 50ක් වෙනුවෙන් තමයි මෙම වැඩසටහන කරන්න බලාපොරොත්තු වෙන්නේ. බලන්ගොඩ MOH කාර්යාලයෙන් 35ක් සහ කල්තොට MOH කාර්යාලයෙන් 15ක් වන වෙන විදියට තමයි තෝරා ගන්න ඉන්නේ. එතකොට මේකෙදී දැනුවත් කිරීමේ වැඩසටහනට අමතරව රු.4000/=ක පෝෂණ මල්ලක් ලබා දීමටත් සැලසුම් කරලා තියෙනවා.

මේ සඳහා රුපියල් දෙලක්ෂ තිස්පන්දහස් එකසිය තිස්පහක ( රු.235 135.00)ක මුදලක් වැයවෙනවා. මේකෙන් කොටසක් අනුග්‍රාහක දායකයින්ගෙන් ලබා ගන්නත් බලාපොරොත්තු වෙනවා. ඒ නිසා මේ වැඩසටහනට පැවැත්වීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ඩබ්.ලක්රුවනි සමරනායක මැතිනිය</u>**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා</u>**
ගරු සභාවෙන් අවසරයි. ඇත්තටම සභාපතිතුමා මේක හොඳ වැඩසටහනක්. අපි පසුගිය වසරවල් වලත් මෙවැනි වැඩසටහන් පැවැත්වූවා. ඉතින් මම මෙහිදී අදහසක් විදියට ඉදිරිපත් කරන්න කැමතියි. ආණ්ඩුවෙනුත් මාස මාස 10ක කාලයක් සඳහා දීමනාව ලබා දෙනවා මව්වරුන්ට . ඉතින් වතු ජනතාවට සහ දිළිඳු ජනතාවට දරු ප්‍රසූතියෙන් පසුවත් මාස 04ක් 05ක් යනකම් හොඳ පෝෂ්‍යදායි බඩු මල්ලක් හරි දීමනාවක් වගේ හරි ලබා දීම කරන්න පුළුවන් ක්‍රමවේදයක් සකස් කරන්න පුළුවන් නම් නම් වඩාත් හොඳයි කියලා මම යෝජනා කරනවා.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
මන්ත්‍රීතුමා දැන් අපි මේක සැලසුම් කරලා ඉවරයි. වතු ජනතාව දැන් සම්බන්ධ කරගන්නවනම් අපි සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලයෙන් අනුමැතියක් ගන්න ඕනි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා</u>**
ඔව් සභාපතිතුමා අපි දන්නවා මෙවැනි දෙයක් සංවිධානය කරනකොට සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලයෙන් අනුමැතියක් ගන්න ඕනි කියලා. මම කියන්නේ දරුවෙක් හම්බ වුණාට පස්සෙත් මාස 04ක් 05ක් වගේ කාලයක් මෙය ඉස්සරහට කරගෙන යන්න සභාව හරහා ක්‍රමවේදයක් සකස් කරන්න පුළුවන් නම් හොඳයි කියලා.

- ඒ අනුව ගැබිනි මව්වරුන්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීමට හා දිළිඳුකම තුරන් කිරීමට කටයුතු කිරීම සඳහා පවත්වනු ලබන වැඩසටහන සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-04 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන දැන්වීම් පුවරු ගාස්තු අවසන් ගිණුම්වලින් ඉවත් කිරීම සම්බන්ධ යෝජනාව**

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
2019 සිට 2023 වර්ෂය දක්වා දැන්වීම් පුවරු වල සඳහන් හිඟය පිළිබඳව විගණන කමිටු රැස්වීමේදී හා ආදායම් අය කිරීමේ ප්‍රගති සමාලෝචන රැස්වීමේදීද පෙන්වා දීලා තියෙනවා. ඒ අනුව අපිට පෙන්වා දීලා තියෙන ඇමුණුම් ගත තොරතුරු සළකා බලලා දැන්වීම් පුවරුවල මේ වනවිට හිඟ ලෙස පෙන්නුම් කරනු ලබන රුපියල් 110280.00 මුදල 2025 වර්ෂයේ අවසාන ගිණුම් සකස් කරනකොට ඒකෙන් කපලා ඉවත් කරලා නිවැරදි කරන්න කටයුතු කරන්න ඕනි. මොකද සමහර දැන්වීම් පුවරු මේ වෙනකොටත් නැහැ. අපිට ලිඛිතව තිබුණට සමහර දැන්වීම් පුවරු ගලවලා අයින් කරලා තියෙනවා. ඒක නිසා මේ ගැන විගණන කමිටුවේදිත් ප්‍රශ්නයක් ආවා. ඒ නිසා මේවා පොත් වලින් කපා ඉවත් කරලා නිවැරදි කරන්න මේ ගරු සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.නන්දසිරි මැතිතුමා</u>**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව දැන්වීම් පුවරුවල මේ වනවිට හිඟ ලෙස පෙන්නුම් කරනු ලබන රුපියල් 110280.00 මුදල 2025 වර්ෂයේ අවසාන ගිණුම් සකස් කිරීමේදී එයින් කපා හැර, නිවැරදි කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු කිරීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-05 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන ප්‍රාදේශීය සභාවක රැස්වීම්**

**වලට සහභාගී වීම වෙනුවෙන් සභාපති , උප සභාපති සහ සභිකවරුන්ට ගෙවනු ලබන මාසික දීමනාවේ උපරිමය සම්බන්ධ යෝජනාව**

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
ප්‍රාදේශීය සභා නව රීති සංග්‍රහයේ 43(1) වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවක රැස්වීම් වලට සහභාගි වීම වෙනුවෙන් සභාපති, උප සභාපති සහ මන්ත්‍රීවරුන්ට ගෙවිය යුතු යැපීම් දීමනා, ගමන් වියදම් දීමනාවල එකතුවේ උපරිමය, සභාවේ වාර්ෂික අයවැය ලේඛනයේ පවතින ආදායම සැලකිල්ලට අරගෙන රු.8000/=ක උපරිමයකට යටත්ව සභාව විසින් තීරණය කරනු ලබන මුදලක් වෙන්න ඕනි කියලා දක්වලා තියෙනවා.ඒ අනුව අපි රැස්වීමකට ආවම සභිකයෙකුට මාසෙකට කොච්චර මුදලක් ගෙවන්න ඕනිද කියලා තීරණය කරන්න ඕනි. තීරණය කරලා ඒකට සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලා යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.අසෝක්කුමාර් මැතිතුමා</u>**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා</u>**
සභාපතිතුමා ඒක අපිට පැහැදිලි නෑ.පොඩ්ඩක් විස්තර කරන්න පුළුවන්ද

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
මන්ත්‍රීතුමා, අපේ මන්ත්‍රීතුමෙක් හෝ තුමියක් සභා රැස්වීමකට හරි කාරක සභා රැස්වීමකට හරි ආවොත් සභාපතිට රු.1000/=ක් , උප සභාපතිට රු .800/=ක් සහ මන්ත්‍රීකෙනෙකුට රු.700/=ක් වෙන විදියට දවසට ගෙවීමක් කරනවා. මේ සම්පූර්ණ මුදල අපිට ගෙවන්න පුළුවන් වෙන්නේ පැය 12ක් ආවරණය කළොත් විතරයි. නැත්තම්, ඒ කියන්නේ පැය 12ට අඩු කාලයක් වුණොත් අපි මේ මුදලෙන් භාගයක් තමයි ගෙවන්නේ. ඒ කියන්නේ සභාපතිට රු.500/=ක්, උප සභාපතිට රු .400/=ක් සහ මන්ත්‍රී කෙනෙකුට රු.350/=ක් වෙන විදියට. ඒ අනුව එක් මන්ත්‍රීවරයෙකුට මසකට ලබා ගන්න පුළුවන් මුදලේ උපරිමය රු.8000/= ඉක්ම වන්නේ නැති මුදලක් වෙන්න ඕනි. ඒ මුදලට තමයි අපි සභාවේ අනුමැතියක් ගන්න ඕනි. මේ දීමනාව ගන්න මන්ත්‍රීතුමා හෝ තුමිය ගෙවීම් වවුචරයක් ඉදිරිපත් කරලා තමයි තමන්ට ලබා ගන්න තියෙන මුදලක් ලබා ගන්න ඕනි. ඒ අනුව මසකට ගෙවන උපරිම මුදලට අනුමැතියක් තමයි අපි මේ වෙලාවේ ගන්න ඕනි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා</u>**
සභාපතිතුමා ඔය දීමනාව දෙන්නේ අපිට දැනට ලබා ගන්න රු.15000/=ක දීමනාවට අමතරව වෙනමද

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
ඔව් මන්ත්‍රීතුමා.

- ඒ අනුව ප්‍රාදේශීය සභාවක රැස්වීම් වලට සහභාගි වීම වෙනුවෙන් සභාපති , උප සභාපති සහ මන්ත්‍රීවරුන්ට ගෙවීමට තීරණය කරන ලද, මාසික දීමනාවේ උපරිමය වන රු.8000/=ක මුදල සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-06 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන අක්කර බදු කපා හැරීම සම්බන්ධ යෝජනාව**

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
මේ කාරණාව ගැන කතා කළොත් ඇතැම් අක්කර බදු ඒකක සඳහා වසර ගණනාවක් තිස්සේ අය කර ගන්න බැරි වුණු හිඟයන් පවතිනවා. මේ වන විට අක්කර බදු සත්‍යාක්ෂණයක් ආරම්භ කරලා

තියෙනවා. දැන් ඒ කටයුතුවල අවසන් අදියරයේ තමයි ඉන්නේ. ඒකෙදී තහවුරු කරුණු කිහිපයක් නිසා අක්කර බදු ඒකක කිහිපයක් ඉවත් කරන්න වෙලා තියෙනවා. මං කියන්නම් ඒ කරුණු මොනවද කියලා.

- ✓ අක්කර බදු සඳහා පවතින ඉඩම් බෙදී යාම. ඒ කියන්නේ හෙක්ටයාර් 01ට වඩා අඩුවෙන් ඉඩම් බෙදී යාම.
- ✓ ඉඩම් කොටස් කර විකිණීම. ඒකෙත් හෙක්ටයාර් 01ට වඩා අඩුවෙන් ඉඩම් කොටස් විකිණීම සිදු වෙලා තියෙන්නේ.
- ✓ නගර සීමාවට අයිති වීම.

ඔන්න ඔය කාරණා නිසා තමයි මේවන විට අපේ ලේඛනගතව පවතින අක්කර බදු ඒකක කිහිපයක් ඉවත් කර සිදු වෙලා තියෙන්නේ. අපි මේ ඉවත් කිරීම් සිදු කරන්නේ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ පවත්නා නීති රීතිවලට අනුගතව. ඒ නිසා මේ සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස මම යෝජනා කරනවා. මම ඒ ලයිස්තුවත් ඉදිරිපත් කරන්නම්.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.නිශාන්ත කිත්සිරි මැතිතුමා</u>**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>නගර සභා සීමාවට අයත් අක්කර බදු ඒකක කපා හැරීම</u>**

- ➢ ඒ අනුව අක්කර බදු සත්‍යාක්ෂණයේදී තහවරු වූ කරුණු මත පදනම්ව, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ පවත්නා නීති රීතිවලට අනුකූලව අදාළ අක්කර බදු කොටස් ඉවත් කිරීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

| අනු අංකය | අක්කර බදු අංකය | අක්කර බදු හිමිකරුගේ නම | මුදල රු: |
|---|---|---|---|
| 01 | 132 | ඩබ්.එම්.ප්‍රේමරත්න | 600.00 |
| 02 | 131 | ඩී.ජී.කරුණාසේන | 600.00 |
| 03 | 236 | කේ. ජුවානිස් | 640.00 |
| 04 | 67 | එම්.එම්.මුක්තාර් | 627.00 |
| 05 | 270 | ජේ.ඩී.පී.ප්‍රනාන්දු | 456.60 |
| 06 | 271 | ආර්.එල්.ඩී.ජයරත්න | 00.00 |
| එකතුව | | | **2923.60** |

**06-07 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන අක්කර බදු ඒකක සඳහා ගාස්තු සංශෝධනය කිරීම සම්බන්ධ යෝජනාව**

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
අප සභාව විසින් අක්කර බදු සඳහා මෙතෙක් අය කර ගෙන ඇත්තේ හෙක්ටයාර 01-05ත් අතර රු:50.00ක මුදලක් සහ හෙක්ටයාර 05ට වැඩි වන සෑම හෙක්ටයාර 1ක් සඳහා රු: 10.00ක මුදලක් විදිහට. මම උදාහරණයක් විදියට කියන්නම්.

හෙ.01 - රු: 50.00
හෙ.05 - රු: 50.00
හෙ.07 - රු: 70.00 (50+10+10)

ඒ අනුව ACLG/13/03/01/1 අංක දරණ 2025 අධීක්ෂණ වාර්තාව මගින් අක්කර බදු ආදායම් අය කිරීම් සම්බන්ධ අඩුපාඩු සම්බන්ධයෙන් ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව සහ 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතෙහි 134 (3) වන වගන්තියට අනුව අක්කර බදු ඒකක සඳහා බදු මුදල් අය කර ගැනීම සම්බන්ධව අපට උපදෙස් ලබා දීලා තියෙනවා. ඒ කියන්නේ, උදාහරණයක් විදියට කිව්වොත්

හෙ.01 - රු: 50.00
හෙ.05 - රු: 250.00 (50*5) (හෙක්ටයාර 05ට වැඩි වන සෑම හෙ.01ක් සඳහා රු:10.00 බැගින් එකතු වේ.)
හෙ.07 - රු: 270.00 (50*5+10+10)

ඒ නිසා 2026 වර්ෂයට ගැසට් පත්‍රයට අක්කර බදු අය කිරීම සම්බන්ධව නිවැරදි තොරතුරු ලබා දීමටත්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතට අනුව අක්කර බදු ගාස්තුව සංශෝධනය කර ගැනීමටත්, ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යොමු කිරීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස මම යෝජනා කරනවා. අවශ්‍ය නම් ප්‍රාදේශීය සභා පනතෙහි අක්කර බදු සම්බන්ධ අදාළ වගන්තිය ඇතුළත් පිටපතක් සහ 2025 අධීක්ෂණ වාර්තාවෙහි පිටපතක්ද මා ළඟ දැන් තියෙනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බී.එන්.දීපශිකා පෙරේරා මැතිනිය</u>**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව 1987 අංක 15 දර ප්‍රාදේශීය සභා පනතට අනුව අක්කර බදු ගාස්තුව සංශෝධනය කර කොට, ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යොමු කිරීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-08 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන නාගරික සංවර්ධන අධිකාරියට අයත් ප්‍රදේශ සඳහා අයදුම්පත්‍ර නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම**

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
අප සභාවට අයත් වසම් 11ක් මේ වන විට නාගරික සංවර්ධන අධිකාරිය යටතට අරන් තියෙනවා. එතකොට ඒ ප්‍රදේශ සඳහා නාගරික සංවර්ධන අධිකාරි පනත තමයි ක්‍රියාත්මක වෙන්නේ. ඒ නිසා මේ ප්‍රදේශ වල ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීමේ සහ ඉඩම් කට්ටිකර විකිණීමේ අයදුම්පත්‍රය මේ වන විට සකස් කරලා තියෙනවා. එතකොට 2025-07-24 දින පැවත් වුණු සැලසුම් කමිටුවේදී තීරණයක් අරන් තියෙනවා ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීමේ අයදුම්පත්‍රය සඳහා රු.500/= මුදලකුත් , ඉඩම් කට්ටිකර විකිණීමේ අයදුම්පත්‍රය සඳහා රු.500/= මුදලකුත් අය කිරීම සුදුසුයි කියලා. ඒ අනුව මෙම අයදුම්පත්‍ර සඳහා තීරණය කරලා තිබෙන එම ගාස්තු සඳහා සභා අනුමැතිය අවශ්‍ය වෙනවා . ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලෙස මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මුදිත ප්‍රසාද් මල්ලිකාරත්න මැතිතුමා</u>**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීමේ අයදුම්පත්‍රය සඳහා රු.500/= මුදලකුත් , ඉඩම් කට්ටිකර විකිණීමේ අයදුම්පත්‍රය සඳහා රු.500/= මුදලකුත් අය කිරීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-09 ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා විසින් ඉදිරිපත් කරන ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල පුළුල් කිරීම සම්බන්ධ යෝජනාව**

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>
අපිට මේ පිළිබඳව තවත් මන්ත්‍රීතුමන්ලාගෙන් සහ තුමියන්ලාගෙන් යෝජනා ඇවිල්ලා තිබුණා.ඇත්තටම අපේ කාර්ය මණ්ඩලය ගත්තොත් ඒගොල්ලන්ට ඉඳගන්නවත් නැති මට්ටමක තිබුණේ. අපි මේ යෝජනාව ගිය සැරේ න්‍යාය පත්‍රයට දැම්මේ නැහැ. හේතුව තමයි අපි මේකේ ප්‍රධාන යෝජනාවක් විදියට මේ සභා ගොඩනැගිල්ල අපිට පුළුල් කර ගන්න ඕනි. දැන් අද වුණත් අපි මේ සභා රැස්වීම තියන්නේ අපේ රැස්වීම් ශාලාවේ. ඒ වගේම තමයි කාරක සභාවක් තිබුණත් තියන්න තැනක් නෑ. ඒ වගේම අපේ මන්ත්‍රීතුමන්ලාට ආවාම ඉන්න කාමරයක්වත් නෑ. හුණ්ඩුවක් වගේ එකක් තමයි තියෙන්නේ. සභාපති කාමරය ටිකක් ලොකු වුණාට අපේ විපක්ෂ කාර්යාලයේ සහ උප සභාපතිතුමාගේ කාමරයේ ඉඩකඩ මදි. අපේ මේ පැත්තේ මන්ත්‍රීතුමන්ලාට නම් සභාපති කාමරේ ඉන්න පුළුවන් ටිකක් හරි ලොකු නිසා. නමුත් අනිත් අයට ඉඩ කඩ මදිනිසා සභාව දවසට විතරක් අපේ උප සභාපතිතුමාගේ කාමරේත් විපක්ෂ මන්ත්‍රීවරුන්ට දෙන්න ඕනි කියලා අපි තීරණය කළා. මොකද සභා ගොඩනැගිල්ලේ ඉඩකඩ ප්‍රශ්නයක් තියෙන නිසා. ඒ නිසා මේ සියල්ල සැලකිල්ලට අරන් තමයි අපි මේ යෝජනාව මේ සැරේ සභාවට ඉදිරිපත් කළේ. මොකද අපිට සභා අනුමැතිය අවශ්‍ය වෙනවා පළාත් සභාවට යවන්න ඉදිරි කටයුතු කිරීම සඳහා . ඒ නිසා මම යෝජනා කරනවා මේ සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.අසෝක්කුමාර් මැතිතුමා**</u>
මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා**</u>
සභාපතිතුමා, මං දැන ගන්න කැමතියි දැනට තියෙන ගොඩනැගිල්ලම අළුත්වැඩියා කරලා පුළුල් කරනවද එහෙම නැත්තම් අළුතින්ම ගොඩනැගිල්ලක් හදනවද කියලා.

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>
ගරු මන්ත්‍රීතුමා අපි දැන් තියෙන ගොඩනැගිල්ලම තමයි පුළුල් කරන්න හදන්නේ. මෙහා පැත්තට කෑල්ලක් අරගෙන. අපි ඒකට කාර්මික නිළධාරිතුමන්ලාගෙනුත් උපදෙස් ගත්තා. එතකොට අපි වියදම අඩු කර ගන්නත් පුළුවන්.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා**</u>
නෑ සභාපතිතුමා අපි වියදම අඩුවෙන් කරන්න ඕනි වැඩත් තියෙනවා. හැමදේම වියදම අඩුවෙන් කළොත් ඒක හොඳ උත්තරයක් වෙන්නේ නැහැ. පාර්ලිමේන්තුව තමයි රටේ නීතිය හදන්නේ. එතකොට පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට ඒ සියළු පහසුකම් දීලා තමයි රටේ නීති හදලා රට පාලනය කරන්නේ. බළන්ගොඩ ප්‍රාදේශීය සභාව ගත්තාම වසම් 53ක් තියෙනවා. කොට්ඨාශ 21 තියෙනවා. ඉතාමත් හොඳ සංවර්ධනයක් තියෙනවා. මං හිතන්නේ අපි දැක්කා කොමසාරිස්වරු සම්බන්ධ වෙලා පසුගිය සභාපතිවරුන් තෝරන ඡන්දවලදී සභා කාර්යාල තියෙන්නේ කොහොමද, සභාපති අසුන තියෙන්නේ කොහොමද , එම සභා ගර්භය තියෙන්නේ කොහොමද කියලා. එතනදි බොහොම කණගාටුවකුත් දැනුණා. දැන් බළන්ගොඩ නගර සභාවේ සභා ගොඩනැගිල්ලත් , ඉඹුල්පේ ප්‍රාදේශිය සභාවේ සභා ගොඩනැගිල්ලත් අළුතින් හදපු එකක්. එතකොට ඒ සභිකවරුන්ටත් සභාවක් කියලා කියන්න පුළුවන් හොඳ තැනක් , හොඳ පරිසරයක් තියෙනවා. ඔබතුමන්ලාගේ හොඳ ආණ්ඩුකාරතුමියක් ඉන්නවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ඉන්නවා වසන්ත පුෂ්පකුමාර මැතිතුමා. එතුමන්ලාට යෝජනා කරලා ඉතාමත් හොඳ , අලංකාර සභා ගර්භයක් හැදුවනම් හොඳයි කියලයි මගේ අදහස. බොහොම ස්තුතියි.

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>
මන්ත්‍රීතුමා ඉතාමත් හොඳ අදහසක් ඉදිරිපත් කළේ. අපි ඒ විදිහට කරමු නේද ඉස්සරහට.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා**</u>

සභාපතිතුමා, පාර්ලිමේන්තුවටත් මන්ත්‍රීවරුන් යවන්නේ මෙතනින්නේ. අපි මෙතනින් හරි විදියට පාර කපලා තිබුණොත් තමයි ඒගොල්ලොන්ටත් පාර්ලිමේන්තු යන්න පුළුවන් වෙන්නේ. දැන් මේ බලන්න පිටිපස්සේ කට්ටියට මොනවත් තියා ගන්නවත් ඉඩක් නැහැනේ. ඔක්කොම අතේ එපැයි තියා ගන්න. ඒ නිසා සභාපතිතුමා ගෙනාපු යෝජනාව මම අගය කරනවා.

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>
හරි මන්ත්‍රීතුමා අපි ඔක්කොම එකතු වෙලා අළුතින් සභාව හොඳ විදිහට හදමු.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා**</u>
නෑ සභාපතිතුමා හැම ව්‍යාපෘතියක්ම අපි හොදම විදියට කරන්න හදනවනේ. එළිය සංවර්ධනය කරනවා. හැබැයි ඇතුළේ සංවර්ධනය අඩුයිනේ. දැන් පහුගිය සභාපතිතුමන්ලා සහ එම මන්ත්‍රී මණ්ඩලය අපි සහයෝගයෙන් වැඩ කරපු නිසානේ මේ රැස්වීම් ශාලාව හැදුනේ. මේ ගොඩනැගිල්ල හැදුනේ. ඔක්කොම සහයෝගයෙන් උත්සහයක් ගම්මු. සභාපතිතුමා මැදිහත් වෙලා හොඳ තීරණයක් ගන්න.

- ➢ ඒ අනුව ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල පුළුල් කිරීමේ ඉදිරි කටයුතු සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

- ❖ පෙ.ව.10.31 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.වජිරා ගීතානි වීරසේන මැතිනිය සභා ගර්භයට පිවිසෙන ලදී.

**06-10 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.ඩබ්.ජී.වීරසේන මැතිනිය විසින් ඉදිරිපත් කරන ප්‍රාදේශීය සභාව සතු බිම් කොටසක් පාසලට පවරා දීම සම්බන්ධ යෝජනාව**

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.ඩබ්.ජී.වීරසේන මැතිනිය අපෙන් ඉල්ලීමක් කරලා තියෙනවා රජවක විද්‍යාලයට යාබදව තියෙන ප්‍රාදේශීය සභාව සතු බිම් කොටස එම විද්‍යාලයට පවරලා දෙන්න කියලා. ඇත්තටම එතුමිය කළේ ඉතාමත් හොඳ යෝජනාවක්. ඒ නිසා අපි මේ ගැන පළාත් පාලන දෙපාර්තමේන්තුව එක්ක සාකච්ඡා කළාම එහෙන් අපිට කිව්වේ මෙම ඉල්ලීම පාසල හරහම ආවොත් තමයි අපිට පහසුවෙන් ක්‍රියාමාර්ගවලට යන්න පුළුවන් කියලා. මොකද මෙතන තියෙන්නේ මෙතුමියගේ ඉල්ලීමක් නිසා.

හරි අපිට දැන් මේ යෝජනාව ගැන කතා කරන්න පුළුවන්. මොකද මෙතුමිය දැන් පාසලෙන් ලබා දුන්න ඉල්ලීම් ලිපිය සභාගත කළා. හරි එහෙනම් ඔබතුමිය මේ ගැන අදහස් දක්වන්න.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.ඩබ්.ජී.වීරසේන මැතිනිය**</u>
සභාපතිතුමනි, මම සභාවට ආපු දවසේ ඉඳන්ම රජවක විද්‍යාලය ගැන කතා කළා. මොකද රජවක විද්‍යාලය කියන්නේ කල්තොට, මැදබැද්ද වගේම තැන්න, මොලමුර, මුල්ගම, බෝවත්ත, දෙපැලමුල්ල යන ප්‍රදේශවලින් පැමිණෙන ළමයි 780 ට අධික ළමයි ප්‍රමාණයක් ඉන්න කීර්තිමත් පාසලක්. ළමයි බොහෝ ප්‍රමාණයක් අධ්‍යාපනය ලැබුවට මේ පාසල භෞතික පිහිටීම අතින් ඉතාමත් කුඩා භූමියක තමයි රජවක විද්‍යාලයට තියෙන්නේ. කොහෙන්වත් භූමිය විශාල කර ගන්න විදියක් නැහැ. දෙපැත්තෙම තියෙන්නේ පෞද්ගලික ඉඩම්. ඒ නිසා ගරු සභාපතිතුමනි, ප්‍රාදේශීය සභාව සතුව හෙක්ටයාර් දශම 0309 ක භූමි ප්‍රමාණයක් තියෙනවා. ඒ භූමි ප්‍රමාණය රජවක විද්‍යාලයට පවරා දීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා. ඒ වගේම එම භූමිය තුළ දැන් පාවිච්චි නොකරන අත්හැරලා දාලා තියෙන කොටසක් තියනවා. ඒ කොටස තමයි මේ ඉල්ලන්නේ. මේ කොටස පාසලට පවරා දීම ඉතා ඵලදායි වෙයි කියලා මම හිතනවා. ඒ නිසා මෙම භූමි කොටස පාසලට පවරා දෙන්න කියලා මම යෝජනා කරනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමි**</u>

ගරු සභාපතිතුමනි, මම මේ යෝජනාව මුලින්ම ස්ථිර කරනවා. අපි අවුරුදු ගණනාවක ඉඳන්ම දන්න රජවක විද්‍යාලය කියන්නේ ඉතාමත්ම කීර්තිමත් පාසලක්. පසුගිය සභා වාරයේදීත් අපි රජවක විද්‍යාලයට භූමි කොටසක් ලබා දුන්නා මේ විදියටම පඩිපෙළක් හදා ගන්න. මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් හොඳයි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.එල්.පී.කුමාර ගුණසිරි මැතිතුමා</u>**

වජිරා මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරපු යෝජනාව රජවක පාසල මගින් ගරු සභාපතිතුමාට මීට කලින් ලිඛිතව දැනුම් දුන්නා. ඒ සම්බන්ධව මටත් ලිඛිතව දැනුම් දීලා තියෙනවා. 06/23 මම මේක සභාපතිතුමාට ඉදිරිපත් කළා. 07/09 වන දින මහා සභාවට ඉදිරිපත් නොකරනවා කියලාත්, මෙය කාර්මික නිළධාරි වෙත ඉදිරිපත් කරනවා කියලත් මට සභාවෙන් ලිඛිතව දැනුම් දීලා තියෙනවා. ඊට අමතර 2019 ත් මේක හිටපු සභාපතිතුමාට ඉදිරිපත් කරලා තියෙනවා. මේකෙ පිටපත් වජිරා මන්ත්‍රීතුමියටත්, ධම්මාරාම ස්වාමීන් වහන්සේටත් යොමු කරලා තියෙනවා. අවුරුදු 04ක් 05ක් තිස්සේ මේක ලිඛිතව දැනුම් දිලා තියෙනවා. මේ සම්බන්ධව ගත්ත ක්‍රියාමාර්ගයක් නැහැ. මම 06/23 ලබා දුන්නු ලිපියට කාර්මික නිළධාරි විසින් ගත්ත ක්‍රියාමාර්ග දැන ගන්න කැමතියි.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

ගරු මන්ත්‍රීතුමා අපිට තාම ඒ ගැන වාර්තා කරලා නැහැ. කාර්මික නිළධාරි වෙත අපි ඒක යොමු කරලා තියෙන්නේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා</u>**

සභාපතිතුමා මේක ඉතාමත් වැදගත් ප්‍රශ්නයක්. 2019 ත් ගරු මන්ත්‍රීතුමා කියන විදියට කාර්මික නිළධාරිතුමාට යොමු කරලා තියෙනවනම් අපි කැමතියි මේක කාරක සභාවක් කරලා හරි ඒ කාර්මික නිළධාරිතුමා මේ ලිපිය සම්බන්ධව වාර්තා කරලා තියෙන්නේ මොනවද කියලා දැන ගන්න.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

ගරු මන්ත්‍රීතුමා මේ ලිපිය දැම්මෙ 2019 ද.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.එල්.පී.කුමාර ගුණසිරි මැතිතුමා</u>**

නැහැ සභාපතිතුමා මම දැනුම් දුන්නේ 06/23. ඒකට තමයි 07/09 දිනෙන් ලිපියක් එවලා තිබුණේ කාර්මික නිළධාරි වෙත යොමු කළා කියලා. නමුත් මේක 2019 දීත් පාසලෙන් හිටපු සභාපතිතුමාට ලිපියකින් දැනුම් දීලා තියෙනවා. වජිරා මන්ත්‍රීතුමියට සහ ධම්මාරාම හාමුදුරුවන්ට ඒකේ පිටපත් යොමු කරලා තියෙනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.ඩබ්.ජී.වීරසේන මැතිනිය</u>**

ගරු සභාපතිතුමනි, 2019 විතරක් නෙවෙයි. ඊටත් කලින් ඉඳලම මේ පිළිබඳව රජවක විද්‍යාලය විසින් වරින් වර ඉල්ලීම් කරලා තියෙනවා. 2019-08-03 වෙනිදා පාසල් සංවර්ධන සමිතිය මගින් රජවක විද්‍යාලය නැවතත් ඉල්ලීමක් කරනවා. ඒ අවස්ථාවේදී රජවක විද්‍යාලයේ ප්‍රවේශ මාර්ගය අවදානම් සහගත නිසා පඩිපෙළක් සකස් කර ගැනීමට විතරක් ප්‍රාදේශීය සභාවෙන් අවසරය දීලා පර්චස් දශම ගණනක් රජවක විද්‍යාලයට නිදහස් කළා. ඉතිරි බිම් කොටස පවරලා දෙයි කියලා තමයි ඉල්ලීම කරන්නේ. හැබැයි මේ වෙනකම්ම රජවක විද්‍යාලයට කාර්මික නිළධාරිතුමෙක් හෝ තුමියෙක් නම් ගිහිල්ලා නැහැ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි, මම මේ සභාව කාරක සභාවක් බවට පත් කරමු කියලා යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.ඩබ්.ජී.වීරසේන මැතිනිය</u>**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ❖ ඒ අනුව කාර්මික නිලධාරිතුමා ගෙන්වා අදාළ ප්‍රශ්නය සාකච්ඡා කිරීම සඳහා මහ සභාව පෙ.ව.10.40ට කාරක සභාවක් බවට පත් කරන ලද අතර අදාළ කරුණු සාකච්ඡා කිරීම ආරම්භ කරන ලදී.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා</u>**

ගරු සභාපතිතුමිනි, මම මේ කාරක සභාව මහා සභාව බවට පත් කරමු කියලා යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.ඩබ්.ජී.වීරසේන මැතිනිය</u>**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ❖ ඒ අනුව කාර්මික නිලධාරිතුමා ගෙන්වා අදාළ කරුණු සාකච්ඡා කිරීම අවසන් කිරීමෙන් අනතුරුව කාරක සභාව නැවතත් පෙ.ව.10.50ට මහා සභාව බවට පත් කරන ලදී.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.ඩබ්.ජී.වීරසේන මැතිනිය</u>**

ගරු සභාපතිතුමනි, අපි මේකේ නෛතික තත්ත්වයන් පිළිබඳව සළකා බලලා ඉදිරි කටයුතු සිදු කරමු.

- ➢ ඒ අනුව බළන්ගොඩ ප්‍රාදේශීය සභාව සතු එම ඉඩම් කොටස අදාළ නෛතික තත්වයන් පිළිබඳවද සළකා බලා, රජවක විද්‍යාලයට පවරා දීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-11 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.එම්.එස්.ධර්මරාජ මැතිතුමා විසින් ඉදිරිපත් කරන පොදු පහසුකම් සඳහා වෙන් කර ඇති ඉඩම් එළි පෙහෙළි කිරීම සම්බන්ධ යෝජනාව**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.එම්.එස්.ධර්මරාජ මැතිතුමා</u>**

සභාපතිතුමනි මම ලිපිය ඉදිරිපත් කළේ ලක්සිරි උයනගම ග්‍රාම සංවර්ධන සමිතිය හරහා. එම සමිතිය මගින් කලින් සභාපතිතුමා ඉන්න කාලේ ඉඩම සම්බන්ධයෙන් විවිධ ක්‍රියාමාර්ග අරන් තියෙනවා. අපි ඒකේ වල් බිහිවෙලා තියෙන කොට ජේසීබී යන්ත්‍ර දාලා සුද්ධ කරලා ක්‍රීඩා පිටියක් විදියට සකස් කරලා ඊට පස්සේ සෝදා පාලුවට ලක්වෙනවට වැලි කොට්ට දාලා ආක්ෂක බැම්මක් සකස් කළා. නමුත් අපි ආපසු භාවිතා නොකරපු නිසා වල් බිහි වෙලා තියෙනවා. මේක ප්‍රාදේශීය සභාව සතු ඉඩමක්. මේක ප්‍රාදේශීය සභාව සතු ඉඩමක් නිසා පාරේ යන අය කුණු ගෙනත් දාන්නෙත් මෙතනට. අපි ඉල්ලීමක් කරන්නේ මෙතන ඉදි කිරීමක් කරන්න නෙවෙයි. ප්‍රාදේශීය සභාවෙන් කම්බි වැටක් දාලා සකස් කරලා තියෙන්නේ. ප්‍රාදේශීය සභාවෙනුත් එක පාරක් ගිහිල්ලා සුද්ධ කරලා තියනවා. ඒ නිසා ඉඩම සංරක්ෂණය වෙලා තියෙනවා. ඉඩමත් නිරවුල් වෙලා තියෙන්නේ. ඉතින් මෙතන ප්‍රදේශයේ දරුවන්ට ක්‍රීඩා කරන්න අවස්ථාව උදා කරලා දෙන්න කියලා තමයි අපි කියන්නේ. කලින් සභාපතිතුමා ඉන්නකොටත් අපිට එතුමාගේ වාචික අවසරය ලැබුණා. ඉතින් මගේ ඉල්ලීම කම්කරු නිළධාරින් මහතුන් යොදවලා සුද්ධ කරලා දෙන්න කියලා. අපේ සහයෝගයත් ඔවුන් සඳහා ලබා දෙනවා . මේක සුද්ධ කරලා ළමයින්ට සෙල්ලම් කිරීම සඳහා අවස්ථාව උදා කරලා දෙන්න කියලා තමයි මම යෝජනා කරන්නේ.

**<u>ගරු උපසභාපති බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා</u>**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ➢ ඒ අනුව ලක්සිරි උයනගම පොදු පහසුකම් වෙනුවෙන් වෙන් කර දී ඇති ඉඩමේ ක්‍රීඩා කටයුතු සිදු කිරීම වෙනුවෙන් භූමිය සකස් කර දීමට අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-12 මොහොමඩ් අබ්දුල්ලා මහතා විසින් ඉදිරිපත් කර ඇති විදුලි ලාම්පුවක් ලබා ගැනීම සම්බන්ධ යෝජනාව**

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

එතකොට මෙතුමා සඳහන් කරනවා කිරිමැටිතැන්න ග්‍රීන්රේන්ජ් පාරේ රාත්‍රියට විදුලි ලාම්පුවක් නැති නිසා රැකියාවල් සඳහා ගොස් එන පිරිස්වලට, කුඩා දරුවන්ට එහෙම සොර සතුරු අවදානම්, සත්තු සර්පයන්ගේ සිදුවන අනතුරු ආදිය සිදු වෙන නිසා ඒ පාරට විදුලි ලාම්පුවක් දාලා දෙන්න කියලා. ඉතින් අපි මෙන්න මෙහෙම අදහසකට ආවා. අපි දැන් පළවෙනි අදියරයේදී කරගෙන යන්නේ දැනට තියෙන විදුලි ලාම්පු ප්‍රතිසංස්කරණය කර ගෙන යන එක. ඊට පස්සේ අපිට දැන් විදුලි ලාම්පු ඉල්ලුම් කරලා මේ වන විට ගොඩක් ලියුම් අවිල්ලා තියෙනවා. විශේෂයෙන් අපි අවධානය යොමු කරනවා ඔය අලි එන ප්‍රදේශ ඒ කියන්නේ විකිළිය, රජවක, මාවෙල, ඉඹුලමුර වගේ පැතිවල ටික කඩිනමින් අළුත්වැඩියා කරන්න. ඊට අමතරව අලුතෙන් දාන්න කියලා ඉල්ලුම් කරන ටික වෙනම ගොනු ගත කරගෙන කාර්මික නිළධාරින් ඒ තැන්වලට යොමු කරලා කඩිනමින් ඉටු කරන්න ඕනි තැන්වලට ප්‍රමුඛත්වය දීලා විදුලි ලාම්පු සවි කරනවා. නැත්තම් ඉල්ලන ඉල්ලන විදියට දෙන්න ගත්තොත් අපිට මේක පිළිවෙලකට කරගන්න බැරි වෙනවා. එතකොට සියලුම ගරු මන්ත්‍රීවරු සහ මන්ත්‍රීවරියන්ගේ අධීක්ෂණය මත තමයි අපි මේවා සවි කරන්න කටයුතු කරන්නේ. ඒ නිසා අලුතෙන්ම විදුලි ලාම්පු දාන්න කියලා ආපු යෝජනා ටික අපි වෙනම ගන්නවා. මගේ අදහස ඒක. ඒ පිළිබඳව ඔබතුමන්ලාට සහ තුමියන්ටත් අදහස් දක්වන්න පුළුවන්.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජී.දනුෂ්ක සමන්ත කුමාර මැතිතුමා**</u>

මුලින්ම මම මේ යෝජනාව ස්ථිර කරන ගමන් අදහසක් දක්වන්න කැමතියි. මගේ ගමටත් විදුලි ලාම්පු 03/04 වගේ අවශ්‍යතාවය තියෙනවා. මට ඒ ටික අරන් දෙන්න පුළුවන් සභාපතිතුමා. මට ඕනි ඒක සමස්ත පද්ධතියට සම්බන්ධ කරගන්න පුළුවන් ක්‍රමවේදයක් මෙහෙන් හදා ගන්න. මට ඒ දෙය කරලා දෙන්න පුළුවන් නම් මට විදුලි ලාම්පු ටික අරන් දෙන්න පුළුවන්.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එන්.විමලසේන දිසානායක මැතිතුමා**</u>

සභාපතිතුමා, ඇත්තටම මේ විදුලි ලාම්පු සවි කරනකොට ඒකට යම් කිසි සැලැස්මක් හදලා ඒ අනුව කරන්න පුළුවන් නම් වඩාත් හොඳයි කියලා මම යෝජනා කරනවා.

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>

අර මන්ත්‍රීතුමාත් හොඳ යෝජනාවක් ගෙනාවා. අපි ඒ සියල්ල එකතැනකට අරගෙන අර ගරු මන්ත්‍රීතුමා කිව්ව විදියට හොඳ සැලැස්මක් හදලා, විධිමත් විදියට, අවශ්‍යතාව සළකා බලලා, ප්‍රමුඛත්වය දෙන්න ඕනි ඒවට ප්‍රමුඛත්වය දීලා මේ වැඩේ කරමු.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා**</u>

සභාපතිතුමා අපේ කොට්ඨාශයෙත් විදුලි ලාම්පු දාලා තියෙනවා. නමුත් ඒවා හරියට නඩත්තු වෙන්නේ නැහැ. බල්බ් තිබුණට ඒවා පත්තු වෙන්නේ නැහැ. අපිට ඒවට දාන්න විදුලි ලාම්පු මෙහෙන් ගන්න පුළුවන්ද . ඒවා මෙහෙන් හයි කරපු ඒවා. දැන් බල්බ් වැඩ කරන්නේ නැති නිසා ඒවට තමයි අලුතින් බල්බ් දාන්න ඕනි.

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>

කොහොමත් මන්ත්‍රීතුමා අපේ පළවෙනි අදියරය ඒක. මෙහෙන් දාලා තියෙන, දැන් භාවිතා කරන්න බැරි ඒවා අළුත්වැඩියා කරලා, අළුතින් බල්බ් දාන එක තමයි මේ දවස්වල කරන්නේ.

- ඒ අනුව අවශ්‍යතාවය සළකා බලා, යම් සැලැස්මක් මත පදනම්ව, අලුතින් විදුලි ලාම්පු දැමීම සහ පවත්නා විදුලි ලාම්පු අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබාදීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-13 ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.එම්.ජයසේන මැතිතුමා විසින් ඉදිරිපත් කරන වීථි ලාම්පුවක් සවි කර ගැනීම සම්බන්ධ යෝජනාව**

**06-14 ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.එම්.ජයසේන මැතිතුමා විසින් ඉදිරිපත් කරන වීථි ලාම්පු අළුත්වැඩියා කිරීම හා නව සම්බන්ධතා ලබා ගැනීමට අදාළ යෝජනාව**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්.ආර්.මලිත් ජයසේන මැතිතුමා**

ගරු සභාපතිතුමා අර කලින් විදුලි ලාම්පු සම්බන්ධව දාපු යෝජනාව සභිකවරයෙක් නෙමෙයි ඉදිරිපත් කරලා තියෙන්නේ.සභිකවරයෙක් නොවන කෙනෙකුට යෝජනා ඉදිරිපත් කිරීමේ හැකියාවත් තියෙනවද කියලා පොඩ්ඩක් බලන්න. මම ලේකම්තුමියට විදුලි ලාම්පු සම්බන්ධ යෝජනා 02ක් ලබා දුන්නා. මේකේ 13 සහ 14 යෝජනා දෙකම මගේ. 02ක් තියෙනවා සභාපතිතුමා කලින් දාපු ඒවා.අපේ ගුණරත්න මන්ත්‍රීතුමාත් දන්නවා එකක් අපේ ආරියදාස මහතාගේ නිවස අසළ තියෙනවා. ඒක අපේ වීදිය. ඒක පත්තු වෙන්නේ නැහැ දැන් කාලයක් තිස්සේ. අනික වතු නිවාසවල බාබු මහතාගේ නිවස අසළ තියෙනවා. ඒකත් කලින් දාපු එකක් ඒකත් පත්තු වෙන්නේ නැහැ. 03 වෙනි එක තමයි සභාපතිතුමා මැද්දෙකන්ද පොල්වත්ත පිවිසුම් මාර්ගය තියෙනවා. ඒක කොන්ක්‍රීට් කරලා අළුතින් ඉදි කරලා තියෙන්නේ. කලින් බස් හෝල්ට් එක ඇරලා මීටර් 200ක් විතර ඉස්සරහට ආවම තමයි ඔය කොන්ක්‍රීට් පාර ඉදි කරලා තියෙන්නේ. පීල්ලකුඹුර පොල්වත්ත කියන ප්‍රදේශය. එතකොට ඒ හරියේ නිවෙස් වල කිසිදු ආලෝකයක් නැහැ. සාමාන්‍යයෙන් 06න් පස්සේ 06 ඉඳන් 08 විතර වෙනකම් මගීන් මාර්ගය භාවිතා කරනවා කිසිඳු ආලෝකයක් නැහැ. මට මතකයි කහවත්ත ප්‍රදේශයේ මීට මාස කිහිපයකට කලින් විශාල ඛේදවාචකයක් වුණා. ඒක මෙතනට අදාළ නෑ.මම අදහස් දැක්වීමක් විතරයි කරන්නේ. අවුරු 14ක විතර ළමයෙක් දූෂණය කරලා තිබුණා. ඉතින් ඒ වගේ අනතුරු තියෙනවා. ඊළඟට ඊයෙත් මම දැක්කා අපේ රාස්සගල පාරේ ලොකු පිඹුරෙක් මම ෆොන් එකෙන් වීඩියෝ කර ගත්තා. එතකොට මේ වගේ ආලෝකයක් නැතිවුණාම සර්පයන්ගෙන් පවා විවිධ අනතුරු වෙන්න පුළුවන්. එතකොට අපේ ප්‍රාදේශීය සභා පනතේ තියෙනවා අපි මහජන සෞඛ්‍ය, මාර්ග, විදුලි ලාම්පු අපි අනිවාර්යයයෙන් අපි සභාව විදියට නඩත්තු කරන්න ඕනි. ඉතින් අපි කල් දාන්න ඕනි යෝජනාත් තියෙනවා, කඩිනමින් ක්‍රියාත්මක කරන්න ඕනි යෝජනාත් තියෙනවා. ඉතින් මේ ප්‍රමුඛතාවය දීලා ක්‍රියාත්මක කරන්න ඕනි යෝජනා තමයි මේ මන්ත්‍රීවරු මේ ඉදිරිපත් කරන්නේ. ඒ නිසා මෙ යෝජනාව ඊළඟ සභාවේත් තවත් යෝජනාවක් වෙන්නේ නැතිව ඔබතුමාට අදම ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් හොඳයි. අපේ කාර්මික නිළධාරින් මහත්තුරුත් සම්බන්ධ කරලා එම විථී ලාම්පු අනිවාර්යයයෙන්ම දාන්න ඕනි. ඒ සඳහා කටයුතු කරන්න කියලත් මම යෝජනා කරනවා.

සභාපතිතුමා මට තව කාරණාවක් තියෙනවා කියන්න. අර බුලත්ගම ආයුර්වේදය ළග බල්බ් එක තොරණක් වගේ හැම වෙලාවේම දැල්වෙනවා. ඒකේ අවශ්‍යතාවය මොකක්ද කියලා මම දන්නේ නැහැ. ඒක අවශ්‍යයි නම් තිබුණට කමක් නැහැ. නමුත් මම විශ්වාස කරනවා වටේම ගෙවල් තියෙනවා cctv කැමරා හයි කරලා තියෙනවා එතනට එවැනි විදුලියක් පාවිච්චි කරනවට වඩා කාගේ හරි මන්ත්‍රිවරයෙකුගේ අවශ්‍යම ස්ථානයකට විථී ලාම්පුවක් හයි කරන්න පුළුවන් නම් ඒක වටිනවා. ඒක පොඩ්ඩක් ඔබතුමා හොයලා බලන්න .

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

මේකයි මන්ත්‍රීතුමා රාස්සගල පාරේ තවම ටිකයි දාලා තියෙන්නේ. අපි ඉස්සරහට ගරු මන්ත්‍රීතුමා කිව්ව විදියට ඊළග සභාවට එනකොට මේ යෝජනාව ගේන්නේ නැතුව ඉමු නේද. එහෙනම් අපි හොඳ විදිහට මේ ටික කරමු. ඔබතුමන්ලාත් ඒ ගැන පසු විපරම් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඩී.ඩී.ජයශීලි ලියනගේ මැතිනිය**

මම ඒ යෝජනාවන් 02 ම ස්ථිර කරන ගමන් අදහසක් ප්‍රකාශ කරන්න කැමතියි. මම දැකලා තියෙනවා මේ විථී ලාම්පු ගොඩක් දහවල් කාලයේදීත් පත්තු කරලා තියෙනවා. ඒක නවත්ව ගන්න මොනව හරි ක්‍රමවේදයක් යොදන්න පුළුවන් නම් හොඳයි.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

ඔව් ගොඩක් වෙලාවට අපි පාරේ යනකොටත් පත්තු වෙනවා නේද. අපි ඒකට ක්‍රමවේදයක් හදමු මේ විථී ලාම්පු ටික සවි කරලා අවසන් වුණාට පස්සේ. අපි ඒකේ වගකීම පවරමු ඒ ආසන්නයේම ඉන්න කාට හරි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා**

සභාපතිතුමා, මම ගිය පාර වීඊ ලාම්පු 04ක් සවි කළා. ඊට පස්සේ ඒ හරියේ ඉන්න කට්ටියට කිව්වා පොඩ්ඩක් බලන්න කියලා. ඒගොල්ලෝ ඒක හරි වගකීමෙන් කරනවා.සවස 06 වෙකොට දානවා. නැවතත් උදේ පාන්දරම නිවනවා. එහෙම හරි කළේ නැත්තම් කට්ටිය දැක්කෙ නෑ වගේ ඔහේ පාරේ යනවා. ලයිට් දවස පුරාම පත්තු වෙනවා. මොකද ඒ ගැන හැගීමක් නැහැ. ඒ ඇරුණම සමහර ස්විච් බිමට හයි කරලා තියෙන නිසා කට්ටිය බයයි නිවන්න යන්න කරන්ට් එක වැදෙයි කියලා. මොකද සමහර වෙලාවට වැස්සක් එහෙම ආවම තෙමිලා එහෙම තියෙන නිසා කරන්ට් වැදෙයි කියලා බයයි.

**ගරු උපසභාපති බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමනි, වීඊ ලාම්පු සම්බන්ධව අදහස් මතු කරපු නිසා මමත් පොඩි අදහසක් කියන්නම්. වීඊ ලාම්පු සමහර තැන්වල අදාළ නොවන තැන්වලත් තියෙනවා. පහුගිය කාලේ ඒවා ස්ථාන ගත කරපු ඒවායේ අඩුවක් තියෙන්නේ. අපි දන්නවා ඔන්න ඔය ප්‍රශ්නේ නිසාම කල්තොට කොළොම්මඩ පාර කියලා තියෙනවා.අන්න එතන තියෙන විදුලි ලාම්පුව එතනම එහා පැත්තේ ගෙයක් මුලට දාලා තියෙනවා. ඒකට හේතුව කියන්නේ නිවන්න කෙනෙක් නැති නිසා දැම්මා කියලා. නමුත් ඒක එතනට දාපු එකේ කිසිම ප්‍රයෝජනයක් නැහැ. ඒ නිසා අන්න ඒ සම්බන්ධවත් අවධානය යොමු කරන්න පුළුවන් නම් හොඳයි. වීඊ ලාම්පු ස්ථානගත කිරිමේදී සුදුසු තැන් බලලා ස්ථාන ගත කරන්න. දැන් එතන විදුලි ලාම්පුව වැඩ කරන්නෙත් නැහැ.අක්‍රීයයි. ගෙදරකට තමයි ඒක දාලා තියෙන්නේ. ඒක මොන පදනමකින් දැම්මද නම් දන්නේ නැහැ.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

එහෙම ඒවත් තියනවා නේද. අපි එහෙනම් මෙහෙම කරමු නේද. දැන් අර අපේ මන්ත්‍රීතුමා සහ අපේ උප සභාපතිතුමා යන දෙන්නම කිව්වේ සමාන අදහසක්. එකක් තමයි වීඊ ලාම්පු නිවන්නේ නැත්තේ අර අපේ කියන හැගීමක් නැතිකම නිසා. අනිත් එක අර බයකුත් තියෙනවා කරන්ට් එක වැදෙයි කියලා. ප්‍රධානම දෙය තමයි අපේ කියන හැගීමක් නැතිකම. මේක දවල් කාලේ පත්තු වෙනකොට මේ අපතේ යන්නේ අපේම දෙයක්ය කියලා හිතන්නේ නැහැ. අපිට ඒවට චෝදනා කරන්න බැහැ සමාජෙට. මොකද දන්නවද හේතුව ආකල්ප වලින් පිරිහුණු ආත්මාර්ථකාමී සමාජයක් තමයි අපි ඉස්සරහ තියෙන්නේ ඒකයි. මමත්වයෙන් පිරිච්ච සමාජයක් තියෙනවා. ඒ මමත්වයෙන් පිරිච්ච සමාජයක කෙනෙකුට හැගීමක් ඇති වන්නේ නැහැ මේක මම විසින් කළ යුතුමයි කියලා. ඒක අනුන්ට පැවරීමම තමයි කරන්නේ. ඒ වගේම තව එකක් තමයි පොදු තැනට හයි කරන්නේ නැතුව තමන්ගේ තැනට හයි කරන්න බලන එක. තමන්ගේ ගෙදර ගාවට විතරක් හයි කරගන්න බලන්නේ ආත්මාර්ථකාමී හැගීමක් එතන තියෙන නිසා. මේ සියල්ලම හොඳ විදියට නිවැරදි කරන්න අපිට කාලයක් යයි. අපි මුලින් ආදර්ශය දෙන්න ඕනි. එතකොට අපිට පහසුයි සමාජයේ ඇතැම් කොටස් පහසුවෙන් නිවැරදි කරන්න. ඔ

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.යූ.සී.තිලක් වික්‍රමසිංහ මැතිතුමා**

සභාපතිතුමා, ස්වයංක්‍රීයව දැල්වෙන සහ පත්තුවෙන ලාම්පු සවි කරන්න පුළුවන් නම් හොඳයි. දැන් අර කොළඹ පවතිනවා වගේ ස්වයංක්‍රීයවම දැල්වෙලා උදෑසන වන විට ආපසු ස්වයංක්‍රීයව නිවෙන වගේ ක්‍රමයක් වුණොත් මේ ගැටලුව අපිට අඩු කරගන්න පුළුවන් කියලා මම හිතනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය බෝවත්තේ ධම්මාරාම හිමි**

ගරු සභාපතිතුමනි. ඒක ඉතාමත් වැදගත් අදහසක්. විදුලි බල මණ්ඩලයේ අනුමැතියක් නැතුව විදුලි පහන් සවි කරලා තිබුණොත් ඒගොල්ලෝ ගලවනවා. ඒ වගේම පහුගිය කාලේ විදුලි ලාම්පු ලබා දුන්නේ අත්‍යාවශ්‍යම ස්ථානවලට විතරයි. අලි ගැවසෙන ස්ථානවලට, ළමයින් වැඩිපුර ගැවසෙන ස්ථානවලට වගේ තමයි දුන්නේ. අපේ මේ මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඒ නිසා ගොඩක් වටිනවා. මොකද වියදමක් යන්නෙත් නැහැ. නඩත්තු කටයුතුත් යම් කාලයකට පමණයි කරන්න ඕනි වෙන්නේ. ඒ නිසා ගැනත් අවධානය යොමු කරන ලෙස මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

අපි ඒ ගැනත් අවධානය යොමු කරමු. මොකද ඒකත් හොඳ අදහසක් නිසා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මුදිත ප්‍රසාද් මල්ලිකාරත්න මැතිතුමා</u>**

මුලික පිරිවැය වැඩි වුණත් සූර්ය විදුලි පද්ධතියකට යන්න පුළුවන් නම් හොඳයි සභාපතිතුමා. එතකොට ලයිට් දාන්න ඔනි වෙන්නෙත් නැහැ නිවන්න ඕනි වෙන්නෙත් නැහැ. විදුලියට පිරිවැයක් යන්නෙත් නැහැ. මූලික ප්‍රාග්ධනය විතරයි පොඩ්ඩක් වැඩි වෙන්නේ. මොකද මේ තියන ටිකට එකපාර හයි කරන්නත් බැරි වුණත් කොටසින් කොටස හරි කර ගන්න පුළුවන් නම් කාලයක් යනකොට අපිට ඒකෙන් හොඳ ප්‍රථිපලයක් ලබා ගන්න පුළුවන්.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

අපිට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදීත් ඔය ගැන සාකච්ඡාවක් ආවා. අපි ඒ ගැනත් සැළකිලිමත් වෙලා ඉදිරි කටයුතු සිදු කරමු.

- ඒ අනුව අවශ්‍යතාවය සළකා බලා, යම් සැලැස්මක් මත පදනම්ව, අලුතින් විදුලි ලාම්පු දැමීම සහ පවත්නා විදුලි ලාම්පු අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබාදීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 06-15 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.පී.එන්.වීරවංශ මැතිනිය විසින් ඉදිරිපත් කරන විදුලි ලාම්පු සවි කර ගැනීම සම්බන්ධ යෝජනාව

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.පී.එන්.වීරවංශ මැතිනිය</u>**

ගරු සභාවෙන් අවසරයි. මම මුලින්ම සභාපතිතුමාට ස්තූතිවන්ත වෙනවා. දාමහන ප්‍රධාන මාර්ගයේ විථි ලාම්පු 02 මේ වන විට අළුත්වැඩියා කරලා තියෙනවා. ඒකට බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා. තව සභාපතිතුමනි අපේ එගොඩ පාර තියෙනවා පළතුරු සෙවනට පොඩ්ඩක් ඉස්සරහින් කොන්ක්‍රීට් කරලා තියෙනවා ඒක මහ කැලේ දක්වා තියෙනවා. විශාල වශයෙන් මහජනතාව යන එන පාරක් ඒ පාරේ අවදානම් සහගත ස්ථාන කිහිපයක්ම තියෙනවා. ඉතින් ඇගලුම් කම්හලේ සේවය කරන අය, තේ කර්මාන්ත ශාලාවේ සේවය කරන අය, රෑ වෙනකොට වැඩ ඇරිලා මේ පාරේ යනවා. මත්ද්‍රව්‍ය ජාවාරම් කරුවන් මේ ස්ථානයේ විශාල වශයෙන් ගැවසෙනවා. ඒ නිසා හරිම අවදානමක් තමයි තියෙන්නේ. අන්න ඒ නිසා මේ පාරේ විථි ලාම්පු 03ක් විතර සවි කර ගන්න අවශ්‍ය වෙලා තියෙනවා. ඉතින් ඒ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.කේ.ඩී.රෝෂන් ක්‍රිස්ටි මැතිතුමා</u>**

ඒ යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

අපිට දැන් දිගටම ආවේ විදුලි ලාම්පු සම්බන්ධ යෝජනා තමයි. ඒ නිසා අපි කලින් කියපු ක්‍රමවේදයටටම යමු. අත්‍යාවශ්‍ය ස්ථානවලට ප්‍රමුඛත්වය ලබා දීලා අනිත් ටික ප්‍රදේශයෙන් ප්‍රදේශයට අළුත්වැඩියා කරමු පළමු පියවර විදියට. ඊළඟ පියවරේදී අලුතින් දාන ටිකත් ප්‍රමුඛතා අනුපිළිවෙලට අවශ්‍යතාවය පිළිබඳ සළකා බලා දාමු. අපි බල්බ් දැම්මට පස්සේ ඔබතුමන්ලාත් ඒ පිළිබව අධීක්ෂණය කරන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජී.දනුෂ්ක සමන්ත කුමාර මැතිතුමා</u>**

සභාපතිතුමනි, මම දන්න තරමට සභාවෙන් බල්බ් දානකොට ඒ තැන්වලට බෝඩ් එකක් ගහනවා. ඒ බෝඩ් නැති තැන්වලත් බල්බ් දාලා තියෙනවා. එතනිනුත් අපිට තීරණය කරගන්න පුළුවන් සුදුසුම තැන්වලටද දාලා තියෙන්නේ කියලා.

- ඒ අනුව අවශ්‍යතාවය සළකා බලා, යම් සැලැස්මක් මත පදනම්ව, අලුතින් විදුලි ලාම්පු දැමීම සහ පවත්නා විදුලි ලාම්පු අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබාදීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 06-16 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ටී.කේ.අලංකාර මැතිතුමා විසින් ඉදිරිපත් කරන මාර්ග විදුලි පහන් ලබා ගැනීම සම්බන්ධ යෝජනාව

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ටී.කේ.අලංකාර මැතිතුමා</u>**
ගරු සභාපතිතුමනි, එගොඩ වලේබොඩ කොට්ඨාශයේ තියෙනවා මේ වෙනකොට විදුලි පහන් 10ක් විතර. ඒ 10න් මේ වෙනකොට ක්‍රියාකාරී මට්ටමේ තියෙන්නේ 03යි. අනිත් ඒවා එකක්වත් වැඩ කරන්නේ නැහැ. අක්‍රිය වෙලා තියෙන්නේ. ඉතින් ඒ ටික අපට සකස් කරලා දෙන්න කියලා තමයි ඉල්ලන්නේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.අසෝක්කුමාර් මැතිතුමා</u>**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
මන්ත්‍රීතුමා අපේ බල ප්‍රදේශයේ ප්‍රදේශීය සභාවෙන් නඩත්තු වෙන බල්බ් 1000ට ආසන්න ප්‍රමාණයක් තියෙනවා. ඒ නිසා සැහෙන්න දවස් ගණනක් යයි ඔය ටික කරන්න. සමහර ඒවායේ වයර් හිටන් කැඩිලා තියෙන්නේ රිලව් එහෙම ඇඳලා දාලා. ඒවත් හදන ගමන් තමයි බල්බ් දාන වැඩෙත් කරන්න තියෙන්නේ. අපේ වසම් 53ක් තියෙනවානේ.

- ඒ අනුව අවශ්‍යතාවය සළකා බලා, යම් සැලැස්මක් මත පදනම්ව, අලුතින් විදුලි ලාම්පු දැමීම සහ පවත්නා විදුලි ලාම්පු අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබාදීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-17 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බී.එන්.දීපශිකා පෙරේරා මැතිනිය විසින් ඉදිරිපත් කරන අලි ගැවසෙන මාර්ගයට විදුලි පහන් සවි කර ගැනීම සම්බන්ධ යෝජනාව**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බී.එන්.දීපශිකා පෙරේරා මැතිනිය</u>**
ගරු සභාපතිතුමනි, මං හිතනවා මේ විදුලි පහන් දැමීම සම්බන්ධ ඒ යෝජනාවන් ෆයිල් වලට දාන එක හොඳයි ඉදිරියේදී ක්‍රියාත්මක වෙන්න. ඒ වුණාට මේ පිළිබඳව වඩාත් අවධානය යොමු කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ තමයි මේ දැනට වසර ගණනාවක සිට වල් අලි ගැවසෙන ප්‍රදේශ ටිකක් තියෙනවා. මගේ කොට්ඨාශයේ වසමකුත් තියෙනවා තෙළිදිරිය. තෙළිදිරිය, මහවලතැන්න, ඉඹුලමුර, එතනින් ගියහම රජවක, බෝවත්ත, දැනට මේ ඊයේ පෙරේදාත් අලි ඇවිල්ලා තියෙනවා විකිළිය වසමටත්. ඉතින් මං හිතනවා ඒකට ප්‍රධාන හේතු මොනවා හරි ඇති අලි මේ පැත්තට එන්න. ඉතින් ඒක නිසා අලි ආවා කිව්වාම, අලියෙක් පාරේ ඉන්නවා කියන එක හරි භයානකයි. සවස 5.30, 6.00 වෙනකොට ඒ පැතිවල අලි පාරට එනවා. ළමයි ඉස්කෝලේ ගිහිල්ලා, පන්ති ගිහිල්ලා, වැඩ ඇරිලා මේ පාරවල්වල එන්න බයයි. දැන් මට කෙනෙක් කතා කරලා කිව්වා තෙළිදිරිය වසමේ දෙල්ගහඅරාව කියන ගමේ එයාගේ ළමයාට සනීප නැතිව රෑ ත්‍රිවිල් එකකට කතා කරාම එන්න බෑ කිව්වලු පාරේ අලි ඉන්නවා කියලා. ඉතින් මම ඔබතුමාට කියන්නේ අන්න ඒ පාරවල් වලට වීථි ලාම්පු සවි කරන එක හැකි ඉක්මනින් කරලා දෙන්න කියලා. ඒවගේ වෙලාවක හදිසියේ හරි මොනවා හරි කරදරයක් වුණාම, ජීවිතයකට හානියක් වුණාට පස්සේ ඒකට පියවරක් අර ගත්තට වැඩක් නැහැ. මට මතකයි දැන් මාස 1 ½ විතර උඩදී ඔබතුමන්ලාත් සමාජ මාධ්‍යයේ දකින්න ඇති දාමහන පාසල අසළ අලියෙක් බල්ලෙක් පස්සේ පන්නන වීඩියෝ දර්ශනයක් සංසරණය වුණා. ඔබතුමා ඒක දැක්කද නැද්ද කියන්න දන්නේ නැහැ. නමුත් අන්න ඒවගේ දෙයක් අර වගේ කිසිම ලයිට් එළියක් නැති පාරක වුණොත් අලියා අවිල්ලා ඇගේ හැපෙනකම්ම මිනිස්සු දන්නේ නැහැ. ඉතින් ඒක නිසා මං ඉල්ලා සිටිනවා ඔබතුමාගෙන් මේ යෝජනාව ඉක්මනටම ක්‍රියාත්මක කරන්න කියලා. එහෙම නැතිව කවුරු හරි මනුස්සයෙකුගේ, ළමයෙකුගේ ජීවිතයකට හානියක්, අනතුරක් වුණාට පස්සේ එදාට අපි කවුරුත් කතා කරලා වැඩක් නැහැ. ඔවා ෆයිල් වලට දාලා කාර්මික නිළධාරින් බලනකම් කියලා හිටියොත් වෙන්නේ අන්තිමට අපිට මේකට උත්තරයක් හොයා ගන්න බැරි වෙන එක. ඒක නිසා දැන් ඔය නඩත්තු කරන ඒවා ඒ කරන පිළිවෙළට කරගෙන යන්න. මේ වගේ අනතුරු තියෙන පළාත්වලට එහිදි විශේෂ අවධානයක් යොමු කරලා ඒවා උවමනා තැන්වලට දාන්න කියලා යෝජනා කරනවා වගේම, ඒ පිළිබඳ ඔබතුමාගේ අවධානය වඩාත් යොමු කරන්න කියලත් යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ආර්.නයනජිත් හේමාල් මැතිතුමා</u>**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
එතුමිය කියන්නේ අපේ විථි ලාම්පු දාන වැඩපිළිවෙළේදී ඔය කියන ප්‍රදේශ පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන්න කියලා. දැන් අපේ බළන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාවේ අලි ගැවසෙන ප්‍රදේශ කිහිපයක්ම තියෙනවා. කොහොමත් අපි වීථි ලාම්පු දාන කොට ඒවට විශේෂයක් කරන්න ඕනි. දැන් අලි ගම් වදින ඒවාට විදුලි වැටවල් පවා සවි කරනවා. අපි වීථි ලාම්පුවක් සවි කරන එකෙන් බලාපොරොත්තු වෙන්නේ අලි බය කරන්න නෙවෙයි අලි ඉන්න බව ඇත තියාම හඳුනා ගන්න එක. දැන් අලි ගම් වැදීම නවත්වන්න ඕනි. ඒක ලොකු ක්‍රියාදාමයක්. එකක් තමයි අභය භූමිවල අනවසරයෙන් වගා කරන එක නවත්වන්න ඕනි. අනිත් එක අභය භූමිවලට විශාල වශයෙන් හරක් ඇතුළු කරනවනේ අලියා උලාගෙන කන්නේ නැහැ හරකා උලාගෙන කනවා.ඊට පස්සේ අනිත් එක තමයි අභය භූමිවල උන්ට කන්න නැහැ. ඉතින් දීර්ඝ ක්‍රියාදාමයක් තියෙනවා. ඒ නිසා අපි සම්බන්ධීකරණ කමිටුවේදී ඔය යෝජනාව ගෙනාවා. නමුත් යෝජනාව ගෙනාවට ක්‍රියාමාර් ගැන කතා කරන්න වන අඩවි නිළධාරිතුමා සම්බන්ධ වෙලා හිටියෙ නැහැ. ඒ නිසා යෝජනාව උඩින් විසිවෙලා ගියා. ඒක බරපතල ප්‍රශ්නයක් දැන්.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මුදිත ප්‍රසාද් මල්ලිකාරත්න මැතිතුමා</u>**
සභාවෙන් අවසරයි. මම මේ අදහස් දක්වන්නේ අපේ සභාවට අයත් බල ප්‍රදේශයක් වන වටවල, රජවක පැත්තේ අලි වැටවල් හයි කරලා තියෙනවා. නමුත් අලි වැටේ ශක්තිමත් භාවයක් තිබුණත් අලි වැටවල් හයි කරලා තියෙන සමහර තැන්වල දං ගස් තියෙනවා. දං ගහ ටික ටික ලොකු වෙනකොට අලි වැටත් ඇදී ඇදී ඉස්සරහට යනවා. ඉතින් මේක සභාවට අයත් බල ප්‍රදේශයක් නිසා කාර්මික නිළධාරිතුමාට මේක පොඩ්ඩක් බලන්න කියන්න. බලලා මේ පිළිබඳව දැනුවත් කරලා මේ ක්‍රමවේදය පොඩ්ඩක් වෙනස් කරන්න කියලා. අලි වැට ඇදී ඇදී ඉස්සරහට එනකොට ඒ දාලා තියෙන අලි වැටෙන් වැඩක් නැති වෙනවා. සෑහෙන්න ලොකු මුදලක් වැය කරලා කරන වැඩේ ප්‍රයෝජනයක් නැති වෙනවා අන්තිමට.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
දැන් ගරු මන්ත්‍රීතුමා, සභාවට අයත් බල ප්‍රදේශයක් තමයි. නමුත් අපේ වපසරිය යටතේ අපිට මේකට මැදිහත් වෙන්න බැහැ. අපිට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී තමයි ඔක කර ගන්න වෙන්නේ. දැන් අපිට අණපනත්, නීති රෙගුලාසි, චක්‍රලේඛ තියෙනවා, වගන්ති තියෙනවා ඒවායේ තියෙන සීමාවන් ඇතුළේ ඉඳගෙන තමයි අපට කටයුතු කරන්න තියෙන්නේ. ඉන් ඔබ්බටත් අපිට ප්‍රශ්න එනවනේ. දැන් මෙතන ඉන්නේ කොට්ඨාශවල ජනතාවගේ කැමැත්තෙන් තේරීපත් වූණු අයනේ. ඒ අය ප්‍රශ්න ගේනකොට තෝරා බේරා ගෙන මෙතනට ප්රශ්න ගේන්න බැහැ. අපිට අවබෝධයක් තියෙන්න ඕනි මේ ප්‍රශ්නේ කොතනටද යොමු කරන්නේ කියලා. එතකොට මේ වගේ සමහර ප්‍රශ්න අපිට යොමු කරන්න වෙන්නෙ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට. ඒකේ න්‍යාය පත්‍රයට දාලා විතරක් මදි අපි අදාළ අයත් සම්බන්ධීකරණ කමටුවට ගේන්න අපි බල කිරීමකුත් කරන්න ඕනි. මොකද ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපති වෙන්නේ ආසනය භාර පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා. එතකොට අපි න්‍යාය පත්‍රයට දාන හැම යෝජනාවකටම වග කියන පුද්ගලයෙක් ඉන්නවා. එයාව අපි කොහොම හරි එතනට ගෙන්වන්න ඕනි. මොකද හැමෝටම අපේ සීමාවෙන් ඔබ්බට ප්‍රශ්න එනවා. අපි ඒවාට උත්තර හොයන්න ඕනි. උත්තර දෙන්න ඕනි.

- ඒ අනුව අවශ්‍යතාවය සළකා බලා, යම් සැලැස්මක් මත පදනම්ව, අලුතින් විදුලි ලාම්පු දැමීම සහ පවත්නා විදුලි ලාම්පු අළුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබාදීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06-18 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.කේ.ඩී.ආර්.ක්‍රිස්ටි මැතිතුමා විසින් ඉදිරිපත් කරන සංවර්ධන**

**යෝජනා ඉදිරිපත් කිරීම සම්බන්ධ යෝජනාව**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.කේ.ඩී.ආර්.ක්‍රිස්ටි මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මම යෝජනාවක් ගෙනාවා තන්ජන්තැන්නේ ඉඳන් කූරගලට යන මාර්ගයේ මුස්ලිම් ගම්මානයට පිවිසෙන කොටසේ පාලමක් තියෙනවා. ඒ කොටසේ අඩි 30ක විතර ප්‍රමාණයක් කිසිම දෙයක් නැහැ. ඒ කොටසේ වාහනයක්වත් ගන්න බැහැ ගැට්ටත් එක්ක. ඒ නිසා මම යෝජනා කරනවා කාර්මික උපදෙසක් අරගෙන එම අඩි 30ක පමණ කොටසට කොන්ක්‍රීට් හෝ තාර යොදලා දෙන්න කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජී.දනුෂ්ක සමන්ත කුමාර මැතිතුමා**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

අපි ඒ පිළිබඳව අවධානය යොමු කරනවා මන්ත්‍රීතුමා.

- ඒ අනුව තන්ජන්තැන්නේ සිට කූරගලට යන මාර්ගයේ, මුස්ලිම් ගම්මානයට පිවිසෙන කොටසේ පවතින අඩි 30ක පමණ ප්‍රමාණය සංවර්ධනය කිරීමේ ඉදිරි කටයුතු සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදි.

**06-19 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.කේ.ඩී.ආර්.ක්‍රිස්ටි මැතිතුමා විසින් ඉදිරිපත් කරන සංවර්ධන යෝජනා ඉදිරිපත් කිරීම සම්බන්ධ යෝජනාව**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.කේ.ඩී.ආර්.ක්‍රිස්ටි මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මම දෙවෙනි යෝජනාව විදියට ඉදිරිපත් කළේ මාර්ගයක් සම්බන්ධයෙන්. ඒකේදි ඒ මාර්ගය පහුගිය රජය සමයේ සංවර්ධනය කරලා තාර දමලා තිබුණා. නමුත් කූරගල සංවර්ධනයේදී ඒ පාර හරහා ට්‍රැක්ටර් රථවලින් පස් ඇද්දා විශාල වශයෙන්. දැන් පාරේ තාර දැම්මද කියලවත් හොයා ගන්න නැහැ. ඒ පාරේ කොහොමවත්ම යන්න අපහසුයි. ඒ නිසා මම යෝජනාවක් විදියට කෙරුවා ඒ පාර ගමේ ගැටලුවක් බවට පත් වෙලා තියෙන හින්දා. ආපහු මම මේ ගැන කතා කරන්නේ නැහැ මොකද ඊට එහා පැත්තෙන් යන්න පාරක් තියෙනවා සමහවිට ඒ පාර පන්සලෙන් කරලා දෙන්න ඉඩ තියෙනවා. සමහරවිට කරන එකකුත් නැහැ. ඒකට විකල්ප මාර්ගයක් තියෙනවා. ඉතින් මේ මාර්ගය සංවර්ධනය කිරීමේ හැකියාවක් තියෙනවනම් ඒක කරලා දෙන්න කියලා තමයි මම යෝජනා කරන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එන්.විමලසේන දිසානායක මැතිතුමා**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

අර අපි කිව්වේ ඊළඟ අවුරුද්දේ අයවැය සකස් කරන කොට යෝජනා ගන්නවා කියලා. බොහෝ දුරට අපට ඉස්සරහට දැන් ඒ සංවර්ධන යෝජනා ඇතුළත් කරන කොට ඔබතුමන්ලාගේ ඔය යෝජනා ඇතුළත් වෙන්න පුළුවන්.

- ඒ අනුව අදාළ මෙම සංවර්ධන යෝජනාව ක්‍රියාත්මක කිරීමට, අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තිරණය කරන ලදී.

**හදිසි යෝජනා**

**06-20 දාමහන ආදාහනාගාරය අලුත්වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තුවක් ලබා ගැනීම සම්බන්ධ යෝජනාව**

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**

දාමහන ආදාහනාගාරයේ පෝරණුවේ පූර්ණ අළුත්වැඩියාවක් කරන්න ඕනි කියලා පෝරණුව වාර සේවා කරන ආයතනයෙන් දැනුම් දීලා තියෙනවා. මේ සම්බන්ධව පළාත් පාලන ඉංජිනේරු ආවා ස්ථානීය පරීක්ෂණයකට. එතුමා අපේ කාර්මික නිළධාරිව දැනුවත් කරලා තියෙනවා ආදාහනාගාර සම්බන්ධව පවතින අනුමත ආයතනයකට පෙන්වලා පරීක්ෂා කරලා ඇස්තමේන්තුවක් අරගෙන ඉදිරි කටයුතු සිදු කරන්න කියලා. ඒ අනුව ආදාහනාගාර පිළිබඳව තාක්ෂණික දැනුමක් තියෙන රජයේ ආයතනයක් තමයි ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය කියලා කියන්නේ. අපි එහෙන් ඇස්තමේන්තුවක් ඉල්ලා සිටියා . ඒ අනුව ඒගොල්ලෝ අදාළ සේවාව සපයන්න රු. 56 640.00 මුදලක් අය කරනවා කියලා අපිට ලිපියකින් දැනුම් දීලා තියෙනවා. මේ ලිපියට අනුව සේවා ගාස්තුව සහ 18%ක වැට් මුදලත් එක්ක තමයි අපි අර කලින් කියපු වියදම දක්වලා තියෙන්නේ. ඒ අනුව පොරණුව අළුත්වැඩියා කිරීමේ කටයුතු කඩිනමින් කරන්න ඕනි. මොකද අපිට ආපු ආදාහන ආපසු හරවලා පැල්මඩුල්ලට යවන්න වුණා මේ ගැටලුව නිසා. ඒ නිසා මෙම සේවා ගාස්තුව සඳහා අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.සමන් කුමාර මැතිතුමා</u>**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය මගින්, ආදාහානාගාරයේ පෝරණුව පරීක්ෂා කිරීම සඳහා යොදවනු ලබන, ඉංජිනේරු මහතාගේ සේවා ගාස්තු වන රු.56 640.00 මුදල ගෙවීමටත්, අදාළ අළුත්වැඩියා කටයුතු කඩිනමින් කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දීමටත් මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**<u>07. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම</u>**

**07-01 <u>ටෙන්ඩර් කමිටු වාර්තාව</u>**

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
2025-07-16 දිනැති ටෙන්ඩර් කමිටු වාර්තාව ඉදිරිපත් කරලා තියෙනවා. ඒ සඳහා මේ ගරු සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.
**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.එම්.සනත් ධර්මරාජ මැතිතුමා</u>**
එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව 2025-07-16 දිනැති ටෙන්ඩර් කමිටු වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**07-02 <u>මුදල් කමිටු වාර්තාව</u>**
**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
2025-07-28 දිනැති මුදල් කමිටු වාර්තාව ඉදිරිපත් කරලා තියෙනවා. ඒ සඳහා මේ ගරු සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඩබ්.දර්මදාස මැතිතුමා</u>**
ඒ යෝජනාව මම ස්ථිර කරනවා

- ඒ අනුව 2025-07-28 දිනැති මුදල් කමිටු වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**07-03 <u>පරිසර හා පොදු පහසුකම් කමිටු වාර්තාව</u>**

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**
2025-07-23 දිනැති පරිසර හා පොදු පහසුකම් කමිටු වාර්තාව ඉදිරිපත් කරලා තියෙනවා. ඒ සඳහා මේ ගරු සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.කේ.ඩබ්.ජගත් නිලන්ත කුමාර මැතිතුමා</u>**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව 2025-07-23 දිනැති දිනැති පරිසර හා පොදු පහසුකම් කමිටු වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**07-04** <u>**කාර්මික කමිටු වාර්තාව**</u>

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>
2025-06-26 දිනැති කාර්මික කමිටු වාර්තාව ඉදිරිපත් කරලා තියෙනවා. ඒ සඳහා මේ ගරු සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.කේ.ඩබ්.ජගත් නිලන්ත කුමාර මැතිතුමා**</u>
එම යෝජනාව මම ස්ථිර කරනවා

- ඒ අනුව 2025-06-26 දිනැති දිනැති කාර්මික කමිටු වාර්තාව සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**08. ලැබීම් වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ , එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු වෙනත් ලේඛන**

**08-01** <u>**2025 ජූලි මස ආදායම් වියදම් වාර්තාව**</u>

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>
2025 ජූලි මස ආදායම් වියදම් වාර්තාව ඉදිරිපත් කරලා තියෙනවා. ඒ සඳහා මේ ගරු සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩබ්.තුෂාර කුමාර මැතිතුමා**</u>
එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>
2025 ජූලි මස ආදායම් රැස් කිරීමේ ප්‍රගති වාර්තාව ඉදිරිපත් කරලා තියෙනවා. ඒ සඳහා මේ ගරු සභාවේ අනුමැතිය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩබ්.තුෂාර කුමාර මැතිතුමා**</u>
එම යෝජනාව මම ස්ථිර කරනවා.

- ඒ අනුව 2025 ජූලි මස ආදායම් වියදම් වාර්තාවට සහ 2025 ජූලි මස ආදායම් රැස් කිරීමේ ප්‍රගති වාර්තාව සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**09.** <u>**සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම්**</u>

<u>**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**</u>
දැන් අවස්ථාව තියෙනවා අපේ ගරු මන්ත්‍රීතුමන්ලාට සහ තුමියන්ලාට මේ සභාව ඉදිරිපිට කුමන හෝ අදහස් දැක්වීමක් කරන්න තියෙනවනම් කරන්න. ඔබතුමන්ලා විනාඩි 03ට පමණ සීමා වෙන කෙටි අදහස් දැක්වීමක් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. හැමෝම කතා කරන්න අවශ්‍ය නැහැ. විශේෂයෙන් යමක් කියන්න තියෙනවනම් විතරක් ඉදිරිපත් කරන්න.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඩබ්.දර්මදාස මැතිතුමා**</u>
ගරු සභාපතිතුමනි, ලේකම්තුමියනි, ගරු මන්ත්‍රීතුමන්ලා සහ තුමියන්ලාගෙන් අවසරයි. මේ කාරණය මම මීට කලිනුත් මතුකළා. අපේ වසම ඒ කියන්නේ කළුපේඩිගම වසමේ රණවිරු මාවතට ග්‍රෙවල් දාලා යන්න පුළුවන් විදියට පිළිසකර කරන්න, ඒක ක්‍රියාත්මක කරන්න කියලා තිබුණා පළාත් සභාවෙන් ඒකට අදාළව 2024-11-27 දිනැතිව ලිපියක් එවලා තිබුණා. මටත් ඒකේ පිටපතක් ලැබුණා. ලේකම්තුමියත් ඒක දන්නවා. ඒ කාර්යය ඒ දවස්වල පොඩ්ඩක් කරගෙන ආවා. හැබැයි ගැටළුවක්

ආවා වර්ෂා කාලය ආපු නිසා වැඩේ හරියාකාරව කරගෙන යන්න බැරිවුණා. ඊළඟට මම වර්ෂා කාලයෙන් පස්සේ නැවත ලේකම්තුමියගෙන් ඇහුවා එතකොට කිව්වා අපේ බැකෝ යන්ත්‍ර 02ම කැඩිලා ඒ 02ක හදන්න ඕනි හැදුවට පස්සේ තමයි කරගන්න වෙන්නේ කියලා. එතකොට මේ වෙනකොට අපේ ඒ ප්‍රදේශයේ කුඹුරුවල අස්වනු නෙළන්න ඉතාමත් ආසන්නයි. හැබැයි ඒ පාරේ දැන් වළවල් තියෙනවා. වැහි කාලේට පොඩි පොඩි පොකුණු තමයි තියෙන්නේ. ඉතින් මේ කාලේ අස්වැන්න නෙළුවට පස්සේ ඒවා අරන් යන්න විදියක් නැහැ. ඉතින් සභාපතිතුමනි, ලේකම්තුමියනි, බැකෝ යන්ත්‍රය මේ වන විට හදලා තියෙන්නේ කියලා මම දන්නවා. මට ආරංචියක් ආවා. ඒ නිසා ඉතා ඉක්මනින්, මම දන්නේ නැහැ හරියටම කාරණය මට ආරංචිය ලැබිච්චි නිසයි මම කතා කළේ මට ඒ කාර්යය ඉතා ඉක්මනින් කරලා දෙන ලෙසට මම ඉල්ලීමක් කරනවා. ඊළඟට තහනම් මාතෘකාවක් තියෙනවා විදුලි ලාම්පු ගැන .ඒ ගැන පොඩ්ඩක් කතා කරන්න ඕනි. මොකද කළුපේඩිගම ආසන්නයේ තමයි ඔය අලි ගැටළුව තදටම තියෙන ප්‍රදේශය වන්නේ. අනිත් ඒවා සුළු කොට තැකුවා නෙවෙයි. ඒවායෙත් මේ ගැටළුව තියෙනවා. හැබැයි මෙහේ මිනිස් ජීවිත පවා නැතිවෙලා තියෙනවා. මේකට එක හේතුවක් විදියට අලි නොදැක ක්ෂණයකින් වාහනයකින් එනකොට එකපාරටම ඉස්සරහට ඇවිල්ලා වාහනවලට පහර දීපු අවස්ථාත් තිබ්බා. ඉතින් ගරු සභාපතිතුමනි, අපේ ප්‍රදේශයේ ගොවීන් වාහන 20ට ආසන්න ප්‍රමාණයක් මේ කොටියගල ප්‍රදේශයට එළවළු අරන් යනවා. විශේෂයෙන් රාත්‍රි කාලයේදී. මේ අයට ලොකු අවදානමක් තියෙනවා මේ අලි ගැටලුව සම්බන්ධව. මෙතන දාලා තියෙන ඒවාත් සමහර ඒවා අක්‍රියයි. ඒ සම්බන්ධව වාර්තාවකුත් මට ලබන සතියේ වන විට ලේකම්තුමියට භාර දෙන්න පුළුවන්. ඒ වගේම කාර්මික නිළධාරි මහත්මයෙක් සම්බන්ධ කරලා වීථි ලාම්පු දැමිය යුතුම ස්ථාන කිහිපයක් තියෙනවා ඒවට ඒවා දාන්න කඩිනමින් කටයුතු කරන්න කියලා ඉල්ලමින් මගේ කතාව අවසන් කරනවා. ස්තූතියි.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

මන්ත්‍රීතුමා අර බැකෝ යන්ත්‍රය තාම හදලා නැත. අපිට හදිසියේ දෙන්න වුණා අර දාමහනේ පාර පුපුරලා වැලි කොට්ට වගයක් දාන්න පැයකට දෙකකට වගේ දුන්නා. තාම හදලා නෑ. කාර්මික නිළධාරි මහත්තයෙක් ගෙනල්ලා බලවන්න ඉන්නේ. තාම හැදුවෙ නැහැ. හැදුවට පස්සේ ගන්න පුළුවන්.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඩබ්.අනුර ක්‍රිෂාන්ත් බස්නායක මැතිතුමා</u>**

සභාපතිතුමා, සභාවට ගැටලුවක් නැත්තම් මට ඒක කරලා දෙන්න පුළුවන්.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එන්.විමලසේන දිසානායක මැතිතුමා</u>**

ගරු සභාපතිතුමා, වන අලි ගැටලුව සම්බන්ධයෙන් දර්මදාස මන්ත්‍රීතුමාත් කතා කළා. මේ දවස්වල කළුපේඩිගම නිවෙස්වල කුඹුරුවල ගොයම් කැපීම සිද්ධ වෙනවා. එතකොට දැන් මේ අස්වනු නෙලුවහම ඒවා අරන් යන්නේ රාත්‍රි කාලයේදී. ඒ වගේම මේ දවස් වල වල මිනිමැරුම් වගේ දේවල් සිද්ධ වෙනවා. ඒ නිසාවැඩි කාලයක් දෙන්න බෑ අපිට ඇත්තටම. මේ වීථි ලාම්පු කඩිනමින් දාලා දෙන්න කියලා තමයි මම ඉල්ලන්නේ.

**<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.කේ.ඩී.ආර්.ක්‍රිස්ටි මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි, මීට දින කීපයකට පෙර ඔබතුමාට අපේ තන්ජන්තැන්න කතෝලික දේවස්ථානයෙන් ලිපියක් යොමු කරලා තියෙනවා එම ප්‍රදේශයට ලබා දුන්නු ජලය කප්පාදු වීම සම්බන්ධව. ඒකෙදී ඒක දේවස්ථානයට විතරක් නෙවෙයි ගමේ අනිත් මිනිස්සුන්ටත් ජලය ලැබෙන්නේ නැහැ. RD එකෙන් පාර සුද්ධ කර ගෙන යනකොට තමයි බට ටික විනාශ වෙලා තියෙන්නේ. නමුත් නැවත පිළිසකර කිරීමකට සමිතිය උනන්දු වෙන්නේ නැති නිසා තමයි ඔබතුමාටත්, අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාටත් සභාවේ අවධානය යොමු කරවන්න කියලා ලිපියක් ලබා දුන්නේ. ඉතින් ඒක හදලා දෙන්න කියලා තමයි ඉල්ලීමක් කරන්නේ. ඒ වගේම මතක් කරනවා මේ මාසේ 14, 15 ඒ දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය තියෙනවා. අපිට වතුර ටික සකස් කර ගන්න බැරි වුණ නිසා එම දින 02ට පමණක්වත් ජල බවුසරය ලබා දෙන්න පුළුවන් නම් හොඳයි කියල මම ඉල්ලා සිටිනවා. බට ලයින් එක අලුතින් හදන්න නෙවෙයි, තිබ්බච දේ නැවත සකස් කරන්න RD එකේ අවධානය යොමු කරවන්න කියලත් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**
මන්ත්‍රීතුමා, ඔබතුමාගේ යෝජනාව ගැන අහන්න මම දේවස්ථානයට කතාකළා. නමුත් ඒ වෙලාවේ පසුව කතා කරන්නම් කියලා කිව්වා. ඒ ෆාදර් ඒ වෙලාවේ බිසී කියලා තමයි කිව්වේ. එතකොට ඔබතුමාගේ ප්‍රශ්නය අපි RD එකටත් කියන්නම්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.කේ.ඩී.ආර්.ක්‍රිස්ටි මැතිතුමා**
සමහර විට භාෂාවේ ප්‍රශ්නයක් වෙන්න ඇති. එතුමා දෙමළ. එතන ඉන්න අනිත් පියතුමා නැති අවස්ථාවක් වෙන්න ඕනි.

**ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා**
ආ හරි එහෙම දෙයක් කිව්වා තමයි.

**ගරු උපසභාපති බී.එල්.ඒ.ධනුෂ්ක නන්දසිරි මැතිතුමා**
ගරු සභාපතිතුමා ඇතුළු සියළු මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. මට පොඩි කාරණා කීපයක් ගැනම කතා කරන්න තියෙනවා. එකක් තමයි දැන් පහුගිය කාලයක් තිස්සේ රජයේ යම් යම් අකර්මන්‍යතා තිබුණා. රාජ්‍ය පරිපාලනය පැත්තෙනුත් යම් යම් අකර්මන්‍යතා තිබුණා. එතකොට මෙන්න මේවත් එක්ක තමයි නව රජයට අවස්ථාව ලබා දීලා තිබුණෙ. ඉතින් මේවා සම්බන්ධව සොයා බලා අදාළ ආයතන අපේ මට්ටමට ගෙනහල්ලා වේගවත් කරලා රටේ සංවර්ධනය සඳහා මේවා ක්‍රියාත්මක කර ගැනීම සඳහා නව රජයට ලොකු කාර්ය භාරයක් පැවරුවා මහජනතාව. එතකොට ඒ කාර්යභාරයත් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු විදියට අපට ලබා දුන්නා. ප්‍රාදේශීය සභාව නියෝජනය කරන්න අවස්ථාව දීලා අදහස් යෝජනා මේ සභාවට ගෙනහල්ලා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහාත් තමයි ජනවරමකින් අපව මෙතනට එවලා තියෙන්නේ. මහජන නියෝජිතයෝ විදියට අපි නිරන්තරයෙන් මිනිස්සුත් එක්ක ගැටෙනවා. අපේ මන්ත්‍රීවරු තමයි මිනිස්සුත් එක්ක ගැටෙන්නේ. මිනිස්සුන්ගේ අදහස්, යෝජනා අපි තෝරා ගැනීම කෙසේ වෙතත් ගැටලු විදියට සභාවට ඉදිරිපත් කරනවා. එතකොට සමහර ගැටලු අපි ඉදිරිපත් කරනකොට අපිට සමහර ඒවට උත්තර හම්බ වෙනවා. සමහර ඒවට ලැබෙන උත්තර බලනකොට ගැටලු සහගත තත්ත්වයන් ඇවිල්ලා තියෙනවා. මගේ යෝජනාව තියෙන්නේ අපි දැන් රාජ්‍යයට පහුගිය කාලේ එල්ල වෙච්ච චෝදනාව තියනවනේ රජයේ නිළධාරින් ක්‍රියාත්මක නොවීම , ඒවගේ තියෙන වේගවත් බව සම්බන්ධ ගැටලු තමයි රටක් කඩා වැටෙන්න හේතුවක් වෙන්නේ. මොකද ඒවගේ සක්‍රීය බව අඩු වෙනකොට මිනිසුන්ට දැනෙනවා. එතකොට මන්ත්‍රීවරු දන්නවා මේ යෝජනා සභාවට ගෙනල්ලා ක්‍රියාත්මක කරන්න ලොකු වෙහෙසක් ගන්න ඕනි. ඉතින් මේ විදියට අපි නිවැරදි කර ගන්න ඕනි තැන් නිවැරදි කර ගමු. වේගවත් කරන්න ඕනි තැන් වේගවත් කර ගමු. ඒකට අපි අපේ නිළධාරින් මෙහෙයවලා මේ සංවර්ධන ක්‍රියාවළියට ගේන්න ඕනි. ඒ සඳහා කටයුතු කරමු කියන යෝජනාව තමයි මම ඉස්සෙල්ලාම ගේන්නේ. එහෙම නොවුණොත් ඉතින් වෙන්නේ හැම දෙයක්ම කඩා වැටෙන එක. මේකෙන් අපි බලාපොරොත්තු වෙන්නේ නැහැ එක රැයකින් සම්පූර්ණයෙන් මේ හැම දෙයක්ම වෙනස් කරන්න. අපි මේ තියෙන උදාසීනත්වයන් බිඳින්න ඕනි කියලා තරයේම කියා සිටිනවා. අපි දන්නවා පහුගිය කාලේ ආණ්ඩුවල තිබුණු ප්‍රතිපත්ති එක්ක රජයන් කඩා වැටෙන්න ප්‍රධානමතම හේතුව වුණේ මේ නිළධාරින් තුළ තිබුණු වංචාව, දූෂණය, ඔවුන්ගේ තිබුණු ආකල්ප. ඉතින් අපි මේ රට ගොඩනගන්න නම් සංවර්ධනය වේගවත් කරන්න ඕනි. ඒකෙදි ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා හැටියට ඔබතුමා සහ මේ සභාවට ලොකු වගකීමක් තියෙනවා මේකට මැදිහත් වෙලා යම් කිසි අවධානයක්, මීට වඩා වැඩි අවධානයක් යොමු කරලා මේ සංවර්ධන කටයුතු වේගවත් කරන්න. තව කාරණා කීපයක් තියෙනවා මට මතු කරන්න එකක් තමයි මම අර ප්‍රශ්නයක් ඇහුවා බුදුගල පාර්ක් එක සම්බන්ධව. ප්‍රශ්න කීපයක්ම ඇහුවා. ඒකට මට අවිල්ලා තියෙන්න් උත්තරේ විදියට ලිපි ගොනු පරීක්ෂා කිරීමේදී එවැනි ස්ථානයක් නිරීක්ෂණය නොවේ කියලා. ලිපි ගොනුවේ නිරීක්ෂණය වෙන්න දෙයක් නෑ. ගොඩනැගිල්ලක් තියෙන්නේ. මං ජීවත්වන ප්‍රදේශයේ මං ඇස් දෙකට දකින දෙයක්. ඒ නිසා මං ප්‍රශ්නයක් විදියට ඊළඟ සභාවට යොමු කරන්නම්. එතකොට පාර්ක් එකට මුදල් ගෙව්වේ ප්‍රාදේශීය සභාවෙන්ද කියන එක ගැනත් ප්‍රශ්නයක් තියෙනවා. මොකද මං දන්න විදියට ප්‍රාදේශීය සභාවේ සල්ලි යොදවලා තමයි පාර්ක් එක හදලා තියෙන්නේ. එතකොට අයිති නැති භූමියකට මුදල් යෙදෙව්වේ කොහොමද කියලා ප්‍රශ්නයක් එනවා. එතකොට ප්‍රදේශවාසීන් ඉල්ලීමක් කරනවා මේ පාර්ක් එක සංවර්ධනය කරලා දෙන්න කියලා. එතකොට වෙළඳ ව්‍යාපාරයක් වගේ ආරම්භ කරන්න මේ වගේ දේවල් පිළිබඳව පොඩ්ඩක් සොයා බලා ඉදිරියේදී කටයුතු කරමු කියලාත්

මම ඉල්ලනවා. ඊළග එක තමයි මම තව යෝජනාවක් ගෙනාවා වේළඹය පොළ භූමිය සම්බන්ධව. එතකොට මේ සම්බන්ධව මට කියලා තියෙනවා අදාළ දේවල් නිරීක්ෂණය කරන්න සභාව අනුමැතිය දෙනවා කියලා. ඉතින් අපි මේවා පිළිබඳව මැදිහත් වෙලා ඉක්මනින් ක්‍රියාත්මක වෙමු කියලා මම ඉල්ලනවා. මොකද මේවා ඇදෙන්න ඇදෙන්න ඔහේ යට යනවා. ඊට පස්සේ මේවාට අපි මැදිහත් වුණ එකේ වටිනාකමකුත් නැතුව යනවා. ඊට පස්සේ ගමේ මිනිස්සුන්ට හිතෙනවා මේගොල්ලන්ටත් මේවා කියලා වැඩක් නෑ, වැඩක් කරන්නෙත් නෑ කියලා. ඔන්න ඔය කාරණා ටික තමයි මට කතා කරන්න තියෙන්නේ. ඉතින් කළ යුතු දේ කෙසේ හරි කරන්න ඕනි. හැබැයි අණපණත්, නීති රෙගුලාසිවලට යටත්ව තමයි අපි ඒ හැම දෙයක්ම කරන්න ඕනි. සමාජයට කළයුතු කාර්යභාරයක් තියෙනවා. මේ රාමුව තුළ ඉඳගෙන අපි ඒ දේවල් වලට මැදිහත්වෙලා ඉටු කරන්න ඕනි. නීතියෙන් හරි වෙන යම් හේතුවකින් හෝ අපිට අදාළ කාර්යයන් ඉටු කරන්න බාධාවක් එනවනම් අපි බලන්න ඕනි ඒවා මැඩපවත්ව ගන්න පුළුවන් කොයි විදියකටද කියලා. ඉතින් අපි හැමවෙලාවෙම එකතු වෙලා සුහදතාවයෙන් තමයි මේ වැඩ කටයුතු කරන්න ඕනි.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

අර ඔබතුමා ඉදිරිපත් කරපු බුදුගල යෝජනාව සම්බන්ධ ගැටලුවේදී මම කාර්මික නිළධාරිතුමා ගෙනල්ලා විමසීමක් කළා. එතනදි ආපු පිළිතුර තමයි අපිට වැසිකිළි පද්ධතියක් හදන්න කියලා ඉල්ලීමක් ඇවිල්ලා තියෙනවා. ඒ ඉල්ලීම අනුව තමයි සභාවෙන් ඔය වැසිකිළි පද්ධතිය හදලා දීලා තියෙන්නේ. එතකොට ඔතන වෙළඳසැලක් තියෙනවා. ඒක සභාවෙ නෙවෙයි. එතකොට ඔය භූමිය සභාවට අයිති භූමියකුත් නෙවෙයි. ඒ වගේම උප සභාපතිතුමා කිව්වා අපේ වැඩ බලාපොරොත්තු වෙන මට්ටමට නැහැ කියලා. වේගවත් බව මදි කියලා. ඒකට හේතුව තමයි නිළධාරින් හැම වෙලේම වග කියන්නේ චක්‍රලේඛ සහ අණපනත්, වගන්තිවලට. අපි ජනතාවගේ පැත්තෙ ඉන්න නිසා හැම තිස්සේම බලන්නේ ඉන් ඔබ්බට ගිහින් යමක් කරන්න. ඒ නිසා අපිට ඉක්මනටම මේ ප්‍රශ්නවලට උත්තර හොයා ගන්න පුළුවන් වෙයි. සෑම ප්‍රශ්නයක්ම අපිට දීලා තියෙන්නේ උත්තරයකුත් එක්ක. උත්තරයක් නැති ප්‍රශ්න ලෝකේ කොහෙවත් නෑ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩබ්.තුෂාර කුමාර මැතිතුමා</u>**

ගරු සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, මේ මාසේ අපේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව තිබුණා. මම ඒ රැස්වීමට සහභාගි වුණා. මම එහිදි එගොඩ වලේබොඩ කොට්ඨාශයට අදාළ වැදගත් යෝජනා 02ක් ඉදිරිපත් කළා. එකක් තමයි සභාපතිතුමනි, එගොඩ වලේබොඩ කොට්ඨාශයේ කුඩා තේ වතු හිමියෝ ජීවත් වෙන ප්‍රදේශයක්. ඔවුන්ගේ ඉඩම්වලට මාර්ගයක් නොමැතිවීම නිසා පේරකැටිය හන්දියේ සිට කොවුල්කැටිය දක්වා මාර්ගය සංවර්ධනය කිරීමට අවසර ඉල්ලලා යෝජනාවක් දුන්නා. ඒකෙදි ඇත්තටම කුඩා තේවතු හිමියෝ විශාල දුෂ්කරතාවලට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. මොකද ඔවුන්ගේ තේවතු වලට කන්ද උඩහට යන්න ඕනි. පොහොර ටික කරේ ගෙනියන්න ඕනි. දළු ටික කඩලා කන්ද පහළට අරන් එන්න ඕනි. දළු ටික කඩනවට අමතරව ඔවුන් විශාල මහන්සියක් වෙන්න ඕනි දළු ටික පල්ලෙහාට ආපසු අරන් එන්න. ඉතින් මම සම්බන්ධීකරණ කමිටුවට යෝජනාව දැම්මා. නමුත් මට ඒ පිළිබඳව අදහස් දක්වන්න අවස්ථාවක් හම්බවුණේ නැහැ.ඒ පාර කිලෝ මීටර් 07ක් විතර කැපෙන්න ඕනි. ඉතින් ඒ පාර කපන්න කලින් ගොඩනැගිලි පර්යේෂණ ආයතනය, මධ්‍යම පරිසර අධිකාරිය එහෙම සම්බන්ධ කරගෙන ස්ථානීය පරීක්ෂාවක් කරලා ඒ පාර කපන එක හොඳයි කියන එක තමයි මගේ පෞද්ගලික අදහස. ඒ වගේම තමයි මම තව යෝජනාවක් දුන්නා එගොඩ වලේබොඩ කොට්ඨාශයටම වැදගත් වෙන මාර්ගයක් සම්බන්ධව. ඒ තමයි වලව අද්දර මාර්ගය සංවර්ධනය කිරීම සම්බන්ධ යෝජනාව. අවුරුදු ගාණකින් සංවර්ධනය වෙලා නැහැ. ඔබතුමාටත් මතක ඇති එක පාරක් වැඩකට ගියා ඒ පාරේ. ඔබතුමාත් එවෙලේ කිව්වේ මේකේ යන්නේ කොහොමද හක්ක පනින පාරක්නේ කියලා. එතකොට ඒ පාරේ වැදගත්කම තමයි වලේබොඩ ජනතාවට මං හිතන්නේ දැනට තියෙන මාර්ගය හරහා නගරයට එන්න කිලෝ මීටර් විසි ගාණක් තියෙනවා. ඒ මාර්ගය අපිට හදා ගන්න පුළුවන් නම් ඒ පාරෙන් බළන්ගොඩ නගරයට එන්න තියෙන දුර ප්‍රමාණය කිලෝ මීටර් 08ක් විතර අඩුවෙනවා. ඒ වගේම ඒ මාර්ගය හරහා යන්න එන්න පහසුකම් නෑ. ප්‍රවාහන පහසුකම් නෑ. බස් එකෙන් බැස්සත් කිලෝ මීටර් 02ක් විතර පයින් එන්න ඕනි. පොළට ගියත් බඩු ටික කරේ තියාගෙන කිලෝ මීටර් 02ක් විතර පයින් එන්න ඕනි. ඉතින් ඒ

යෝජනාවත් මම ඉදිරිපත් කරලා තියෙනවා. ඉතින් ඒ සඳහා මේ සභාවේ අවධානය යොමු කරන්න කියලා තමයි මගේ පෞද්ලික අදහස වෙන්නේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.ඉක්බාර් මැතිතුමා</u>**

ගරු සභාවෙන් අවසරයි. සභාපතිතුමනි, මේ අපි හැමදාම කතා කරන ගැටලුවක් ගැන තමයි මම අදහස් දක්වන්නේ. ඒ තමයි මේ කසළ ප්‍රශ්නය. අපිට මේ කසළ කළමනාකරණය කරන එක විශාල ගැටලුවක් වෙලා තියෙන්නේ. අපි නිවාස කමිටුවේදීත් මේ ගැන කතා කළා. අපි නිවාස කමිටුවේ පැය 02/03ක් වාඩි වෙලා කතා කළත් වැඩක් වෙන්නේ නැහැ අපිට මේකට විසඳුමක් සොයා ගන්න අපහසුයි නම්. අපේ කොළණිය, මහවත්ත, දෙහිගස්තලාව කියන ප්‍රදේශවල හරියට මේ කුණු ප්‍රශ්නෙ තියෙනවා. ඉතින් මේ ටික තියෙන්නෙත් නගර සභාවේ සීමාවේ මායිමේනේ. ඉතින් ඔබතුමාට පුළුවන් අපිට මෙහෙන් ඒ ප්‍රශ්නය විසඳා ගන්නකම් නගර සභාවේ සභාපතිතුමා එක්ක හරි කතා කරලා ඒගොල්ලොත් එක්ක ඒකාබද්ධ වෙලා තාවකාලිකව මේ කුණු ටික බැංකියවත්තට ගෙනියන්න ක්‍රමවේදයක් හදා ගන්න. නැත්තම් කුණු ටික අරහෙට මෙහෙට විසකරලා දාල තියෙනවා මිනිස්සුන්ට පාරේවත් යන්න බැහැ. ප්ලාස්ටික් පොලිතින් ඔක්කොම පාරේ. බල්ලෝ ඇදලා දානවා ඒවා. එහෙන් මදුරුවොත් බෝවෙනවා. ඉතින් සභාපතිතුමනි, නගර සභාවේ සභාපතිතුමාටත්, ඔබතුමාටත් කතා කරලා අඩුම තරමේ සීමාවෙ තියෙන කුණු ටිකවත් ගෙනියන්න පුළුවන් නම් වඩාත් ලේසියි. ඉතින් ඉක්මනින් වෙන්න ඕනි දෙයක් තමයි මේ කුණු ටික දාන්න ක්‍රමවේදයක් හදා ගන්න එක. නගර සභාවේ සභාපතිතුමාත් එක්ක කතා කරලා අපි ගියපාර එහෙම වැඩක් කළා. එතකොට ඒගොල්ලොන්ට දවස් 02/03ට පාරක් කුණු ටික එකතු කරලා තියා ගන්න කියලා අපිට ට්‍රැක්ටරයක් යවන්න පුළුවන්. අනිත් එක තමයි සභාපතිතුමනි, අපි නිවාස කමිටුවේදි කතා වුණා මැදබැද්ද පැත්තේ ප්‍රජා ජල යෝජනා ක්‍රමයක් තියෙනවා කියලා ඒක නිරීක්ෂණය කරන්න යමු කියලා. ඉතින් ඊයේ කමිටුවේදී දැනගන්න ලැබුණා ජල බෝඩ් එකේ අවසරය නැතිව එතනට යන්න බැහැ කියලා. ඉතින් ඒක අපේ බලප්‍රදේශයේ තියෙන තැනක් නිසා අපිට එහෙම යන්න හැකියාවක් නැද්ද කියන ඒක පොඩ්ඩක් බැලුවනම් හොඳයි සභාපතිතුමා.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

බොහොම හොඳයි මන්ත්‍රීතුමා.අපි ඔය කසළ ප්‍රශ්නෙ ගැන නගර සභාවේ සභාපතිතුමාත් එක්කත් කතා කළා. එතකොට එතුමා කිව්වා දැන් තියෙන ටෙන්ඩරය ඉවර වුණාම තමයි කතා කරන්න පුළුවන් කියලා. එතකොට ඔය කසළ ගැටලුව විශාල වශයෙන් තියෙන්නේ දෙහිගස්ලාව, කිරිමැටිතැන්න, මහවත්ත කියන ප්‍රදේශවල. දැන් බළන්ගොඩ නගර සභාවේත් ප්‍රශ්නයක් තියෙනවා දැන් බැංකියවත්තෙත් ඉඩ මදි. ඊට අමතරවත් එතන ලොකු ගැටලු ටිකක් තියෙනවා. එතන කසළ විරෝධයකුත් තියෙනවා මිනිස්සුන්ගෙන්. දැන් මිනිස්සුන්ට කසළ වදයක් වෙලා තියෙනවනේ. ඇත්තටම කසළ වදයක් වෙන්න හොඳ නැහැ. එතකොට අපි දැන් ඉස්සරහට ඉඹුල්පේ සහ නගර සභාව එක්ක එකතු වෙලා අක්කර 10 විතර තියෙන වත්තක් තියෙනවා. අපි සම්බන්ධීකරණ කමිටුවේදීත් කතා කළා. එතන පොදු තැනක් විදියට ගන්න ඉක්මනටම. මේ ප්‍රශ්නය මග හරින්න පුළුවන් ප්‍රශ්නයක් නෙමෙයි. මොකද අපේ පනතේ ප්‍රධානම අංශයක් තමයි කසළ එකතු කිරීම. මොකද අපි වරිපනම් බදුත් ගන්නවනම් ඔවුන්ගේ කසළ ටික අනිවාර්යයෙන් එකතු කරන්න ඕනි. අපි ඒකට බැඳිලා ඉන්නවා. අපි හැමෝටම තියෙන බරපතල ගැටලුවක් තමයි ඔක. අපිට දැන් තැන් 02ක් තියෙනවා. එකක් තමයි වැලිපත කසළ අංගනය. අනික තොටුපලතැන්න කසළ අංගනය. නමුත් අපිට තියෙන්නේ ගොඩනැගිල්ල විතරයි දැන්. අපිට එතනට මොකුත් අරගෙන යන්න බැහැ. මොකද ගම්වාසීන් විරුද්ධ නිසා. අපි එන්න කලිනුත් ඔතනට කුණු ගෙනියන්න උත්සාහ කරලා තිබුණා. නමුත් අර විරෝධය නිසා මොකුත් කරන්න හැකියාවක් නැතිවෙලා. ඒ නිසා අපි මේකට ඉක්මනටම උත්තරයක් හොයමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.පී.නිලන්ති වීරවංශ මැතිනිය</u>**

ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසරයි. මං බස් හෝල්ට් එකක් සම්බන්ධ යෝජනාවක් ඉදිරිපත් කළා. ඒකට මොකද වුණේ කියලා දැන් ගන්න කැමතියි මුලින්ම. අනික කිරිමැටිතැන්න මංසන්ධියේ බ්‍රහස්පතින්දා දින පවත්වන පොළ සම්බන්ධව මම අදහසක් ඉදිරිපත් කරනවා මගේ කොට්ඨාශය නොවුණත්. ඒ පොළ සම්බන්ධව මට ලොකු වගවීමක් තියෙනවා. ඒ පොළ සභාවෙන් නඩත්තු කරනවා. ඒ වගේම වෙළඳ ප්‍රජාවට රිසිට්පතකුත් නිකුත් කරනවා. නමුත් වෙළෙන්දන්ට කිසිම

යටිතල පහසුකමක්වත් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මුදල් කමිටුව රැස් වුණ වෙලාවේත් අපි ඔය සම්බන්ධව කතා කළා. ඉතින් අපිට පොළ වෙනත් ප්‍රදේශයකට ගන්න පුළුවන් කමක් නැහැ. පොළේ ඉන්න වෙළෙන්දෝ කැමතිත් නැහැ පොළ වෙන තැනකට අරන් යනවට. පාරිභෝගිකයොයි, වෙළෙන්දොයි දෙගොල්ලොම මෙතනටනේ පුරුදු වෙලා තියෙන්නේ. දැන් වැහි දවසට වුණත් පොළේ එළවළු එහෙම බිම දාගෙන තමයි අලෙවි කරන්නේ. ඒ වගේම පොළ දවසට පුදුම වාහනය තදබදයක් තමයි තියෙන්නේ. ඒ නිසාම අනතුරු වෙන්න තියෙන ඉඩකඩත් සැහෙන්න වැඩියි. ජීවිත හානියක් සිදු වුණොත් එහෙම ප්‍රාදේශීය සභාවට තමයි ඇඟිල්ල දික් වෙන්නේ. ඒ චෝදනාව අනිවාර්යයයෙන් එනවා . ඒ නිසා ඒ නිසා පොළ ඉවත් කරලා මොනවා හරි සංවර්ධන කටයුත්තක් කරනවනම් ඒ වෙළෙන්දෝ එකකත් සාකච්ඡා කරලා මොනවහරි කරනවනම් හොඳයි. එක්කෝ පෙර පාසල වෙන තැනකට අර ගෙන හරි එතන හට් එකක් හරි ගහලා ඒ වගේ දෙයක් හරි. මොකද වෙළෙන්දොයි පාරිභෝගිකයොයි දෙගොල්ලොම අකමැති නිසා වෙන තැනකට පොළ ගෙනියන්න. ඒ නිසා ඒ පිළිබඳව මොනව හරි පිළියමක් යොදනවනම් සුදුසුයි කියලා තමයි මගේ අදහස. ඒ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා මම අදහසක් විදියට ඉදිරිපත් කරනවා.

**<u>ගරු සභාපති ගමඇතිගේ ආරියදාස මැතිතුමා</u>**

අර ඔබතුමිය කියපු බස් හෝල්ට් සම්බන්ධ යෝජනාව පිළිබඳ අපි පළාත් පාලන දෙපාර්තමේන්තුවෙනුත් විමසා බැලුවා. ඒ අනුව අපි මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වෙත යොමු කළා ඉදිරි කටයුතු සඳහා. මොකද ඒක අපේ විෂය පථය තුළ කරන්න පුළුවන් දෙයක් නෙමෙයි. අපිට පුළුවන් ඉදිරි කටයුතු සඳහා අදාළ ආයතනය වෙත යොමු කරන්න. ඊළඟ කාරණය තමයි අර පොළ. අපිට පොළ ඇත්තටම ගෙනියන්න වෙන තැනක් නැහැ. නැත්තම් මෙතන එහා පැත්තෙත් තැනක් තියෙනවා. ඒ වගේ තැනකට ගියොත් පොළේ වටිනාකම නැති වෙනවා. මොකද හන්දියත් එක්ක තමයි පාරිභෝගිකයෝ වැඩි වශයෙන් ඔතනට එන්නේ. එතකොට අර ඔබතුමිය සඳහන් කරපු තැන ත්‍රිකෝණාකාර කෑල්ලක් තමයි තියෙන්නේ. ඒ ඉඩ ප්‍රමාණයත් පොළකට මදි. අපිත් උභතෝකෝටික ප්‍රශ්නෙකට මුහුණ දීල ඉන්නවා මේකට දැන් මොකද කරන්නේ කියලා. ඒක සභාවේ වගකීමක්. මහ පාරේ තමයි. බිම දාගෙන වෙළදාම් කටයුතු කරන්නේ. අපි බලමු එතනට හොඳ ක්‍රමවේදයක් ගන්නේ කොහොමද කියලා.

ඒ අනුව වෙනත් අදහස් සහ යෝජනා නොමැති වීම හේතුවෙන් සභාවේ කටයුතු ප.ව.12.30 ට අවසන් කරන ලදී.

ගමඇතිගේ ආරියදාස
සභාපති
බලන්ගොඩ ප්‍රාදේශීය සභාව